
# ශ්‍රී ලංකාවේ නිදහසේ වජ්‍ර ජයන්තිය (75 වන සමරුව) නිමිත්තෙන් ජාතික විරුවන් අභිමානයෙන් මෙනෙහි කරමු

## ජාතික වීරයන් බිහි වූ පින් බිම

පෙරදිග ධාන්‍යාගාරය හා ඉන්දියන් සාගරයේ මුතු ඇටය වන් අභිමානවත් නාමකරණයකට හිමිකම් කියන අපගේ සුන්දර දේශය වසර 2500ක ලිඛිත ඉතිහාසයකටත් වසර දහස් ගණනක අලිඛිත හා පුරාකථාවලින් යුතු ඉතිහාසයකටත් හිමිකම් කියයි. ජාත්‍යානුරාගයෙන් හා දේශවාත්සල්‍යයෙන් යුතුව එකී අතීතය මෙනෙහි කරද්දී අපගේ හදවත් තුළ ජනිත විය යුතු හැඟීම වන්නේ ඒ සා විසල් ඓතිහාසික ගමන් මගක නියමුවෝ වූ අපේ ආදි මුතුන් මිත්තන් හෙවත් නමක් ගමක් දන්නා මෙන්ම නොදන්නා ජාතික වීරයෝ නොවන්නට ලෝකය තුළ අපගේ ම අනන්‍යතාවකින් නැගී සිටින්නට අපට හැකිවේ ද යන්නයි. අහස සිඹින මහා දාගැබ් මෙන්ම සයුර පරයන මහා වැව් නිමැවූ හෙළ ශිෂ්ටාචාරය මූලිකව බුදු සමයෙන් පෝෂණය විය. කායික ශක්තියෙන් මතු නොව ආධ්‍යාත්මික ශක්තියෙන් ද ආඪ්‍ය විය. එමතු නොව ශ්‍රී ලාංකිකයන් ලෙස අපේ ජාතිය සිංහල, දෙමළ, මුස්ලිම්, බර්ගර්, මැලේ සහ වැදි ඇතුළු විවිධ මිනිසුන්ගේ සුන්දර එකතුවකින් බෞද්ධ, හින්දු, කිතුනු, කතෝලික හා මුස්ලිම් යනාදී විශ්වාස හා ආගම් විවිධත්වයකින් ශක්තිමත් රාජ්‍යයක් ලෙස අද සිංහ ධජය සෙවණේ බැබළෙන්නේ ඒ අතීතයේ විසූ විවිධ ජාතික, ආගමික, අධිෂ්ඨානශීලී හා වීරෝදාර ලේවලින් යුතුව මෙරට ආරක්ෂා කරන්නට ජීවිත පරිත්‍යාගයෙන් කැපවුණු ජාතිමාමක දේශපුත්‍රයන් හා දේශදුහිතෘන් නිසාම ය.



**ඡායාරූප අංක 01- ශ්‍රී ලාංකේය සංස්කෘතිය**

දෙස් විදෙස් අභියෝග මතින් අප රට කළ පෙර රජ දරුවන්ගේ ජාතික අභිලාෂය වූයේ අන් කිසිවක් නොව තම පාලන බල සීමාව තුළ ප්‍රජාතන්ත්‍රවාදය සුරක්ෂිත කරමින් ආදරණීය ජනතාවට හෙවත් දේශයේ දූ දරුවන්ට නිදහසේ ජීවත් වීමට හැකි වටපිටාවක් නිර්මාණය කිරීමයි. දේශයේ අභිවෘද්ධිය හා සංවර්ධනය වෙනුවෙන් කටයුතු කළ ඒ අතීත රජවරුන්ගේ නායකත්වය පුරාතන ලෝකය තුළ ධනයෙන් හා කීර්තියෙන් ආඪ්‍ය වූ බලවත් රාජ්‍යයක් ගොඩනැගීමට සමත් වූහ. ඒ රාජ්‍ය ලෝකයා හැඳින් වූ නම් රාශියකි. ජම්බුද්වීපය (පාලි), රත්නදීපය, සිංහල දීප, සිලෝන් (ඉංග්‍රීසි) සංගලම් (දෙමළ) සිලාන් (අරාබි) සිගෝ (බුරුම) සෙන්කියා (චීන) තම්බපණ්නි, තැප්‍රොබේන් (ග්‍රීක රෝම), සෙයිලාන් (පෘතුගීසි) මෙන්ම රාවණපුර, තාමුදීප්, රාක්ෂපුර, සිව්හෙළය හා ශ්‍රී ලංකාව එම නාමාවලියෙන් කිහිපයක් පමණි. මෙරට රාජ්‍ය බල ප්‍රවේශය ලත් සැම රජ කෙනෙකුගේම මූලික අභිලාෂය වූයේ සිය දේශය දේශපාලන, ආර්ථික, ආගමික හා සංස්කෘතික වශයෙන් සංවර්ධනය කිරීම ය. ඒ සම්බන්ධව වූ නිරාමිස හැඟීමෙන් ඔවුන් සැම විට ම කටයුතු කළහ. නවීන තාක්ෂණයට පවා නිමැවිය නොහැකි අනගිභවනීය හා විස්මිත වෙහෙර විහාර, වාරි පද්ධති, අමුණු ආදිය නිර්මාණයට රාජ්‍ය ධනය නිර්භයව යෙදවූයේ එනිසා ය. අප රටේ පෙර අපර දෙදිග වාණිජ ජාලයේ මර්මස්ථානගත පිහිටීම උපරිමයෙන් ප්‍රයෝජනය ගත් අතීත පාලකයෝ වසර දහසකට වඩා ස්වංපෝෂිත රටක් ලෙස ලෝකයේ පැවති එකම රාජ්‍යය බවට අප රට පත්කළහ. දසරාජ ධර්මය පිළිවෙතෙහි තබා ගෙන නිදහසේ ජීවත් වීමටත්, නිදහසේ සිය ජීවිකා වෘත්තිය සපයා ගැනීමටත් මෙන්ම තම මූලික අයිතිවාසිකම් සුරක්ෂිත සමාජයක ජීවත් වීමට අවශ්‍ය පරිසරය දැහැමෙන් සෙමෙන් සකස් කර දීම රජුගේ ප්‍රධානතම වගකීමක් වූ බව ද පෙනේ. පෙරදිගෙන් හා රට අභ්‍යන්තරයෙන් පැමිණි විවිධ ආක්‍රමණ හා දුර්බලවේග අතික්‍රමණය කළ හෙළ රජවරුන්ට හා දේවත්වයෙන් හා යෝධත්වයෙන් පිදූ විරුවෝ අපේ සදා අභිවන්දනීයත්වයට පත්විය යුතුමය.

## අපරදිග සුළඟට හසු වුණු හෙළ දිව

එහෙත් මෙම දේශීය දේශපාලන හා සංස්කෘතික චින්තනයට ප්‍රබල බාධාව නැතහොත් අනතුර මතුවූයේ යුරෝපීයයන් ගේ පෙරදිග ආක්‍රමණයත් සමගිනි. ශ්‍රී ලංකාවේ බටහිර යටත්විජිතවාදී යුගය ආරම්භ වන්නේ 16 වන සියවස මුල සිදුවූ පෘතුගීසි ආගමනයත් සමඟ ය. එතැන් පටන් වසර 453 ක් බටහිර යටත්විජිත පාලනයට නතු වූ රාජ්‍යයක් වශයෙන් අප කටයුතු කරන ලදි. එවන් අවාසනාවන්ත තත්ත්වයකට රට පත් වීමට 16 වන සියවස ආරම්භ වන විට මෙරට පැවති දේශපාලන පසුබිම මෙන්ම කෝට්ටේ රාජධානියේ අභ්‍යන්තරයේ පැවති ව්‍යාකූල දේශපාලන වාතාවරණය ද හේතු විය. ඒ අනුව දිවයිනට පැමිණි පෘතුගිසි සහ ලන්දේසි ජාතිකයන්ට අදියෙරෙන් අදියර මෙරට වෙරළබඩ තීරයේ බලය පිහිටුවාගැනීමට හැකි විය. එනමුත් අවසන් වරට මෙරට අක්‍රමණය කළ ඉංග්‍රීසීන්ට සමස්ත දිවයිනේම ආධිපත්‍ය පිහිටුවීමට ද අවස්ථාව උදාවීම කැපී පෙනේ.



**ඡායාරූප අංක 02- බටහිර ජාතීන් පෙරදිගට පැමිණීම**

මාලදිවයිනේ මුහුදු තීරයේ වෙළෙඳ බලය හිමිව තිබූ මුස්ලිම් ජාතිකයන් අල්ලා ගැනීමට නැව්නැගි ලොරෙන්සෝද අල්මේදා ඇතුළු පෘතුගීසි නාවුකයන්ගේ නැව අතරමග දියරැළිවලට හසුව ගාලු තුඩුවට 1505දී පමණ ගසාගෙනැවිත් මෙරටට පැමිණි බව සඳහන් වූවත් පූර්ණ අවබෝධයෙන් පැමිණි බව නොරහසකි. කාම්බෝජයට අපනයනයට සකසා තිබූ කුරුඳු හා ඇත් පැටව් පිරි නැව් ඒ වන විට ගාලු වරායේ නවතා තිබී ඇත. ලොරෙන්සෝ ඇතුළු පිරිස එම වරායේ ආධිපත්‍ය හෙබැවූ මුස්ලිම්වරු බිය ගන්වා වරාය තදාශ්‍රිත ස්වදේශීකයන් මිත්‍ර කොට ගෙන වරායේ ගල් පර්වතයේ පෘතුගාල රජුගේ ලාංඡනය නිමවා ඇත. එය ලාංකේය සංස්කෘතිය බටහිරකරණය වීමේ හැරවුම් ලක්ෂයයි. කෙසේ වෙතත් මෙම ජනප්‍රිය පුරාවෘත්තයට අමතරව ඇති තවත් ප්‍රවාදයක් වන්නේ 1506 අගෝස්තු 01දා නැවියන් 300ක් සමඟ ඉන්දියාවේ කොචින් සිට ලොරෙන්සෝ ද ප්‍රධාන පිරිස පැමිණ අතරමග කුණාටුවක් නිසා කොළඹ වරායට සේන්දු වූ බවයි. ඔවුන් අතර සිටි දියෝගු ද මේලෝ නමැත්තෙකු අත සිංහල රජු හමුව පෘතුගාලයට වාර්ෂිකව කුළු බඩු ආදිය ලබා ගැනීමටත් ඊට උපකාර ලෙස ලංකාවේ වෙරළ තීරය හා නැව් තොටවල් ආරක්ෂාවටත් එකඟ වූ බව එම කථාවයි. ඒ වන විට තම බලය යොදවා කප්පම් ඉල්ලූ මුස්ලිම් වෙළෙඳ ආධිපත්‍යයෙන් මිදීමට කෝට්ටේ රජ කළ අටවැනි වීර පරාක්‍රමබාහු රජු විසින් එම තීරණය ගත් බව පැවසෙයි. කොළඹට පැමිණි සුදු මිනිසුන් පිරිසක් තිරාවාණා කමින් ලේ බොති යනුවෙන් පණිවුඩයක් 1505 නොවැම්බර් 15 වනදා රජුට රටවැසියෝ පෘතුගීසි පැමිණීම සැලකර ඇතැයි ද ස්වදේශිකයන් රජු හමුවට පෘතුගීසි නියෝජිතයෝ ව්‍යාජව දීර්ඝ ගමන් මගකින් ගෙන ගොස් ඇතැයි ද එම ඉතිහාස පුවත කියා පායි. "පරංගියා කෝට්ටේ ගියා" යන පිරුළ තැනෙන්නේ ද ඒ ඇසුරෙනි. වසරකට කුරුඳු බහාර් 400ක කප්පමකට රජු එකඟව ඇති අතර අරාබි ජාතිකයන්ගෙන් නැව්තොටවල් ආරක්ෂා කිරීමේ ගිවිසුම රන්පත් දෙකක පෘතුගීසි හා සිංහල භාෂාවෙන් සටහන් කොට ඇත. එතැන් පටන් ශ්‍රී ලංකාව හා පෘතුගාලය අතර රාජ්‍යතාන්ත්‍රික සබඳතා ඔස්සේ විවිධ පෘතුගීසි කණ්ඩායම් මෙරටට පැමිණියහ. එම පෘතුගීසි බලවර්ධනයට විරුද්ධව ස්වදේශීයයන්ගේ නැගී සිටීම් වරින් වර සිදු වූ අතර ක්‍රි.ව. 1562 මුල්ලේරියා සටන බටහිර අධිරාජ්‍ය විරෝධී සටන්වල වැදගත් සන්ධිස්ථානයකි. මායාදුන්නේ සහ පළමුවන රාජසිංහ යන රජවරු මෙම සටනේ දී පෙරමුණ ගෙන කටයුතු කර නිදහස් ජාතියක වැදගත් බව පෙන්වා දුන්නේ ය.

15 වන සියවස අවසාන භාගය වන විට කන්ද උඩරට රාජධානියෙන් ද මෙවැනි ම අභියෝගයක් පෘතුගීසීන්ට එල්ල විය. උඩරට රාජධානිය අතීතයේ සිට පැවත ආ සිංහල රාජධානියේ උරුමක්කරුවා ලෙස නැගී එන්නේ, ක්‍රි.ව. 1592 දී පළමුවන විමලධර්මසූරිය රජු (ක්‍රි.ව. 1591-1604) බලයට පත්වීමෙන් පසුව ය. උඩරැටියන් පමණක් නොව මුහුදුබඩ වැසියන් පවා උඩරට රාජ්‍යය තමන්ගේ රාජ්‍යයේ අගනගරය ලෙසත්, උඩරට රජු තම රජු ලෙසත් සලකන්නට වූයේත්, උඩරට රජවරුන් බුද්ධාගම ආරක්‍ෂා කිරීමට ඉදිරියට පැමිණියේත් ඉන් පසුව බව දැකිය හැකි ය. මේ නිසා පහතරට ප්‍රදේශ යටත් කරගෙන සිටි විදේශිකයන්ගෙන් එල්ල වූ තර්ජනවලට එරෙහිව නැගී සිටීම හා ඔවුන් දිවයිනෙන් පලවා හැරීම උඩරට රාජ්‍යය වෙත පැවරුණ වැදගත් ම කාර්යය විය. ක්‍රි.ව. 1597 වන විට කෝට්ටේ රාජ්‍යය තුළ සිය දේශපාලන ආධිපත්‍යය තහවුරු කර ගත් පෘතුගීසීහු එම කෝට්ටේ උරුමය පදනම් කරගෙන උඩරට ප්‍රදේශයට ද අයිතිවාසිකම් කියමින් එය අල්ලාගැනීමට ප්‍රයත්න දැරූහ. ක්‍රි.ව. 1591 සහ ක්‍රි.ව. 1594 සටන්වලින් ලත් ජයග්‍රහණවලින් පළමුවන විමලධර්මසූරිය රජු බලයට පත් වීම නිසා උඩරටට පෘතුගීසීන් දියත් කළ ආක්‍රමණ අසාර්ථක විය. එහෙත් පෘතුගීසීහු උඩරට රාජ්‍යය ඈඳා ගැනීමේ ඒකායන අරමුණ ඇතිව කිහිප වරක් ම එය ආක්‍රමණය කළහ. එම අරමුණ කිසි විටෙකත් සාර්ථක නොවූ අතර, ක්‍රි. ව. 1602 බලන සටන, ක්‍රි. ව. 1630 රන්දෙණිවෙල සටන හා ක්‍රි. ව. 1638 ගන්නෝරුව සටන යන සටන් ත්‍රිත්වයෙන් ම පෘතුගීසි හමුදා අන්ත පරාජයට පත් කරමින් උඩරට ප්‍රදේශ ජය ගැනීමේ පෘතුගීසි ප්‍රයත්න ව්‍යර්ථ කිරීමට උඩරැටියෝ සමත් වූහ. මෙම සටන් සඳහා පළමුවන විමලධර්මසූරිය, සෙනරත් සහ දෙවන රාජසිංහ යන රජවරු නායකත්වය දුන්නේ ය. රජුගේ නායකත්වය පමණක් නොව, උඩරැටියන් ගේ සමගිය, අනුගමනය කළ සටන් උපක්‍රම සහ මෙරට භූගෝලීය පරිසරය මෙම සටන්වල විජයග්‍රහණයට බෙහෙවින් බලපාන ලදි.

## මිරිස් දී ඉඟුරු ගැනීම

මෙරට බටහිර යටත්විජිතවාදයේ දෙවන ප්‍රකාශනය ලෙස මුහුදුබඩ ප්‍රදේශ ක්‍රි.ව. 1658 දී ලන්දේසීන් අත්පත් කර ගැනීම සැලකිය හැකි ය. ක්‍රි. ව. 1601 මැයි 31 වන දා අද්මිරාල් ජොරිස් වැන් ස්පිල්බර්ජන් ලංකාවට පැමිණි ප්‍රථම ලංදේසි ජාතිකයා විය. පෘතුගීසීන්ට සාපේක්ෂව ලන්දේසීහු සූක්ෂ්ම ක්‍රමානුකූල වාණිජ ප්‍රතිපත්තියක් අනුගමනය කළහ. ලන්දේසි වාණිජ ප්‍රතිපත්තියේ ද මූලික අරමුණ වූයේ දිවයිනේ වාණිජ ඒකාධිකාරය සියතට ගැනීමයි. පෘතුගීසින්ගෙන් වෙරළබඩ නිදහස් කරගැනීමේ අටියෙන් දෙවන රාජසිංහ රජු ලන්දේසීන් ගේ සහය පතා ක්‍රි. ව. 1638 මැයි 23 වනදා ලංදේසීන් හා ගිවිසුම් ගත විය. එය මිරිස් දී ඉඟුරු ගැනීමක් ලෙස ජනප්‍රවාදයට එක් විය. (මෙම කියමන ව්‍යවහාරයේ ඇත්තේ ඉඟුරු දී මිරිස් ගැනීමක් වශයෙනි.) එහෙත් සමස්ත රටම යටතට ගැනීමේ උපක්‍රම සැකසූ ලන්දේසීන් එහිලා මුහුණ දුන් ප්‍රධාන බාධකය වූයේ ද උඩරට රාජධානියයි. උඩරට පාලකයා වූ දෙවන රාජසිංහගේ ක්‍රියාකලාපය මෙහි දී වැදගත් වන අතර, රජුගේ ක්‍රියාකාරකම් හමුවේ ලන්දේසි වරායන් මෙන්ම,

වෙළෙඳාමේ පාලනය ද සියතට ගැනීමට ලන්දේසිහු සමත් වූහ. ක්‍රි.ව. 1760-1765 ලන්දේසි-උඩරට යුද්ධයෙන් හා ක්‍රි.ව. 1766 ගිවිසුමෙන් පසුව දෙපාර්ශ්වය අතර මතභේද රැසක්ම මතුව ආ අතර ලන්දේසීන්ට එරෙහිව ඉංග්‍රීසි ආධාර ලබාගැනීමට උඩරට රජවරු අසාර්ථක උත්සාහයක නියැළුණේ ය. නමුත් ජෝන් පයිබස්, හියු බොයිඩ් හා රොබට් ඇන්ඩෲස් වැනි අය රාජාධිරාජසිංහ රජු හමුව ඉංග්‍රීසි ලංකා රාජතාන්ත්‍රික සම්බන්ධතා ගොඩ නගාගෙන තිබිණ. ක්‍රි. ව. 1795 අගෝස්තු 26 වනදා ලන්දේසීන් සතු වූ ත්‍රිකුණාමලය ෆෙඩ්රික් කොටුව ඉංග්‍රීසිහු විසින් පහර දී අල්ලා ගත්හ. ක්‍රි.ව. 1796 වන විට ඉංග්‍රීසි ප්‍රහාර හමුවේ ලන්දේසි බලය සම්පූර්ණයෙන්ම ලංකාවෙන් ගිලිහිණ. මේ ආකාරයට වෙරළබඩ තීරයේ බලය ගොඩනැගීමට පෘතුගීසීන් මෙන්ම ලන්දේසීන් ද හැකිවිය.

මුහුදුබඩ පාලනය සියතට ගත් ඉංග්‍රීසින්ට විරුද්ධව ක්‍රි. ව. 1797 දී මුහුදුබඩ ප්‍රදේශයේ කැරැල්ලක් ඇති වූ අතර ඊට මූලික හේතුව වූයේ අධික බදු බර ය. ඉංග්‍රීසිහු විසින් මුහුදුබඩ පරිපාලනය ඉංග්‍රීසි වෙළෙඳ සමාගම සහ බ්‍රිතාන්‍ය ආණ්ඩුව යන සංව්‍යූහ දෙක මගින් සිදු කළ අතර වෙළෙඳ සමාගමේ හා ආණ්ඩුකාරයාගේ නිලධාරීන් අතර ඇති වූ මත ගැටුම් නිසා ක්‍රි.ව. 1802 දී මුහුදුබඩ පරිපාලනය සපුරාම බ්‍රිතාන්‍ය ආණ්ඩුව යටතට ගැනිණ. ඉංග්‍රීසිහු උඩරට යටත් කර ගැනීමට මාන බැලූ අතර ක්‍රි.ව. 1803 දී නෝර්ත් ආණ්ඩුකාරවරයා මැක්ඩෝවල් සෙනෙවියා යටතේ එහි පළමු ආක්‍රමණය සිදු කරමින් ක්‍රි.ව. 1803 පෙබරවාරිවල දී එම බලඇණි මහනුවරට ඇතුළත් විය. උපක්‍රමශීලීව පසුබැස සිටි සිංහලයෝ නුවර හා කොළඹ සැපයුම් මාර්ග අවහිර කළහ. පසු බසින සේනාව උඩරැටියෝ විසින් සමූල ඝාතනය කළහ. ක්‍රි.ව. 1815 වන විට උඩරට රාජධානියේ ඇති වූ අර්බුද පාදක කරගෙන එවකට ආණ්ඩුකාර රොබට් බ්‍රවුන්රිග් උඩරට ආක්‍රමණය කළ අතර බෝමුරේ සැඟව සිටි ශ්‍රී වික්‍රම රාජසිංහ රජුව අත්අඩංගුවට ගන්නා ලදි. එහි ප්‍රතිඵලයක් ලෙස අත්සන් කළ උඩරට ගිවිසුමෙන් පසු මෙරට මුළුමනින් ම විජිතයක් බවට පත් වූ අතර මෙරට පැවති ස්වාධීනත්වය ද බිඳ වැටුණි.

## හිරු නොබසින අධිරාජ්‍යයට නතුව

ජාතික වීරයෝ බිහි වන්නේ ජාතිය අනතුරට පත්වන අවස්ථාවල දී ය. කූට උපක්‍රම මගින් මෙරට රාජ්‍ය බලය සම්පූර්ණයෙන්ම පැහැර ගන්නට ඉංග්‍රීසිහු සමත් වුව ද ඔවුන් යටතේ දීනයන් ලෙස අතපය බැඳ ගෙන සිටින්නට මෙරට සුජාත පුත්තු සූදානම් නොවූහ. ලොව බලවත්ම රාජ්‍ය වූ හිරු නොබසින අධිරාජ්‍යයට විරුද්ධව ශ්‍රී ලාංකිකයෝ එළි බට ජාතික නිදහස් සටන ආරම්භ වන්නේ ඉන් පසුව ය.



**ඡායාරූප අංක 03- ශ්‍රී වික්‍රම රාජසිංහ රජු අත්අඩංගුවට ගත් මැදමහනුවර බෝමුරේ**

කුඩැල්ලෙකු තරමටවත් හිංසාවක් නොමැතිව, ක්‍රි.ව 1815 දී ශ්‍රී වික්‍රම රාජසිංහ සහසුනෙන් පහකොට උඩරට රාජ්‍යය ඉංග්‍රීසීන්ට පවරා දීමට හැකි සම්මුතියකට එළඹීමට හැකි වූ බව ජෝන් ඩොයිලි නම් ඉංග්‍රීසි නිලධාරියා සඳහන් කර තිබේ. මෙකී ගිවිසුම සම්මත වීමේ දී උඩරට රාජ්‍යය වෙනුවෙන් රදල ප්‍රධානීන් ද, බ්‍රිතාන්‍ය කිරීටය වෙනුවෙන් රොබට් බ්‍රවුන්රිග් ආණ්ඩුකාරවරයා ද අත්සන් කර තිබේ. සෙංකඩගල අගනරයෙහි රාජකීය මාලිගා අභ්‍යන්තරයෙහි පිහිටි මඟුල් මඩුවේ දී අත්සන් කරන ලද මෙකී ගිවිසුම අත්සන් කළ අවස්ථාව පිළිබඳ ව වර්ෂ 1815 මාර්තු මස 06 වැනි දින නිකුත් කරන ලද ගැසට් පත්‍රයේ මෙසේ දක්වා තිබේ.






**ඡායාරූප අංක 04- 1815 උඩරට ගිවිසුම අත්සන් කළ මඟුල් මඩුව අද සහ එදා**

"බ්‍රිතාන්‍යයේ අති උතුම් රිජන්ට් කුමාර මහා රාජෝත්තමයාණන් වහන්සේ වෙනුවෙන් ආණ්ඩුකාර උතුමාණන් වහන්සේ හා හමුදා සේනාවේ නායකයාණෝ එක් පාර්ශ්වයකින් ද, අදිකාරම්වරු, දිසාවේවරු, ඇතුළු මහනුවර දිසාවේ ප්‍රධානීහු ද, අනෙක් පාර්ශ්වයෙන් රටවැසියන් වෙනුවෙන් ද, රැස් වී මොහොට්ටාල, කෝරාළලා, විදානේලා, ආදී රට ඇතුළේ සුළු ප්‍රධානීන් හා වැසියන් ද මහත් සමූහයක් ඉදිරිපිට දී අද දින රජමාලිගා අභ්‍යන්තර මඟුල් මඩුවේ ශාලාවේ දී අති ගම්භීර සම්මන්ත්‍රණයක් පවත්වන්නට යෙදුණා ඇත. මහා රාජෝත්තමයාණන් වහන්සේ ආණ්ඩුව කන්ද උඩරට දිසාවන පිහිටු වීම සඳහා මුලින් ඇති කර ගන්නා ලද සම්මුතියේ කොන්දේසිවලට අනුව පිළියෙල කරන ලද්දා වූ ප්‍රසිද්ධ ලේඛනයක් හෙවත් ගිවිසුම් පත්‍රයක් ඊට පෙර ඉදිරිපත් කරන ලදුව එය පළමුව ඉංග්‍රීසියෙන් ද, දෙවනුව සිංහලෙන් ද කියැවීමෙන් පසු ඒකමතික තීරණයකට එළඹ ගන්නා ලදි."





**ඡායාරූප අංක 05- උඩරට ගිවිසුම අත්සන් කළ මේසය සහ පුටුව (අස්ගිරිය)**

## රට වෙනුවෙන් උණුවුණ ලේ

ඒ අනුව 1815 මාර්තු 02 වෙනි දින මහනුවර මඟුල් මඩුවට රැස් වූ රොබට් බ්‍රවුන්රිග් ආණ්ඩුකාරවරයා සහ රදල ප්‍රධානීන් යෝජිත ගිවිසුමේ වගන්ති එකින් එක කියවා සාකච්ඡා පවත්වද්දී විවිධ මතභේද පැන නැඟීම හේතු කොට ගෙන ගිවිසුම පිළිබඳ තීරණයකට එළඹිය නොහැකි තත්ත්වයක් උදාවිය. එසේ වුව ද ඉංග්‍රීසි සොල්දාදුවන් විසින් ගුවනේ ලෙළදෙමින් තිබූ සිංහලේ ජාතික කොඩිය වූ සිංහ කොඩිය පහත හෙළා ඉංග්‍රීසීන්ගේ කතිර කොඩිය ඉහළ එස වූ බව සඳහන් වේ. ඒ වන විටත් මඟුල් මඩුවේ සිදුවන දේ පිළිබඳ ව විමසිල්ලෙන් දළදා මාලිගාවේ තේවාව පැවැත්වීමට සූදානමින් සිටි ජාතිය පිළිබඳ උදාර හැඟීම්වලින් යුක්ත වූ අස්ගිරි පාර්ශ්වයේ **වාරියපොළ සුමංගල නාහිමියෝ** අහසේ දිදුලමින් තිබූ කතිර කොඩිය දැකීමෙන් කෝපාවිෂ්ට වූ උන්වහන්සේ සිංහලේ සිංහ කොඩිය අහසට නැංවූහ. නමුත් මේ පිළිබඳ ව විවිධ මතවාද සහ අදහස් පවතින බව දක්නට ලැබේ. එනමුත් ඒ මෙහොතේ උදාවූ අනපේක්ෂිත තත්ත්වය පිළිබඳ සමාජයේ දැඩි විරෝධතාවයක් පැවති බව මෙමගින් අවබෝධ වේ.

ඒ අනුව ක්‍රි. ව. 1815 ගිවිසුම ඇත්ත වශයෙන් අත්සන් කරනු ලැබූයේ ප්‍රචලිතව පවතින පරිදි මාර්තු 02 වෙනි දා නොවේ. ආණ්ඩුකාරවරයා හා රදල ප්‍රධානීන් කිහිප දෙනෙකු විසින් මාර්තු 10 වෙනි දින ද හිටපු මහ අදිකාරම් ඇහැලේපොළ හා තවත් දිසාවේවරුන් දෙදෙනෙකු විසින් එම මස 18 වෙනි දින ද එය අත්සන් කරන ලදි. ඒ අනුව වසර 2300කට ආසන්න කාලයක් තිස්සේ බුදු දහමින් පෝෂිත වූ ද ප්‍රෞඪ ඉතිහාසයකට උරුමකම් කියමින් රජවරුන් සමඟ රටවැසි ජනතාව එකතුව සිය දිවි දෙවෙනි කොට ආරක්ෂා කරමින් වාසය කළා වූ ද සභ්‍යත්වය ඉතා කුට ලෙස යටපත් කොට විනාශකර දැමීමට ඉංග්‍රීසීන් විසින් වර්ෂ 1815 මාර්තු 02 වෙනි දින සිට ම ක්‍රියාත්මක විය. එහෙත් එය නිදහස් සටනක් හෝ එබඳු සටනක ආරම්භයක් හෝ නොවුණේ, ඒ වනවිට සිංහලේ රාජ්‍යය බ්‍රිතාන්‍යයන්ට යටත් වී නොතිබුණ බැවිනි. එහෙත් ඒ සිංහලේ නිදහස අහිමි වීමේ ආසන්නයට ම පැමිණ තිබූ අවස්ථාවකි. එය ඉංග්‍රීසීන්ගේ චාටු බස් තිබූ තාන්න මාන්නවලට රැවටී සිටි ඇතැම් සිංහල ප්‍රධානීන්ට යළි සිතා බැලීමට අවස්ථාවක් ලබාදීමක් විය. දේශයේ ස්වෛරීත්වය ආරක්ෂා කර ගැනීම වෙනුවෙන් නිශ්චිත මෙහොතේ විරුවන් බිහි වන බවට එය කදිම නිදසුනකි.

## රාජකීය හමුදාවට විරුද්ධ පළමු හටන

ගිවිසුමෙන් පසු බ්‍රිතාන්‍යයන්ගේ ක්‍රියාකාරිත්වය ක්‍රමක්‍රමයෙන් හෙළි විය. එනමුත් ගිය නුවණ ඇතුන් ලවා ගෙන්වා ගැනීමට නොහැකි සේ මෙරට ජනතාවට අත් වූ ඉරණම අවබෝධ විය. ඒ අනුව උඩරැටියෝ බ්‍රිතාන්‍ය විරෝධී ප්‍රථම සටන දියත් කිරීම සඳහා පෙළගැසුණහ. දේශප්‍රේමී හැඟීම්වලින් වෙල්ලස්සේ තිබූ නොසන්සුන්තාව ජාතිභ්‍රෂ්ඨ බ්‍රිතාන්‍ය විරෝධී මහා නිදහස් සටනක් බවට පත් වූයේ උඩරට සිහසුන සඳහා උරුමකරුවෙකු ඉදිරිපත්වීමත් සමඟ ය. වර්ෂ 1817 සැප්තැම්බර් මාසයේ භික්ෂූන්වහන්සේලා කිහිප නමක් පිරිවරා ආ නායක හිමි නමක් කතරගම දේවාලය වැඳ පුදා ගෙන උඩරට රාජ්‍ය කතරගම දෙවියන් විසින් තමා හට පවරාදෙන ලදැයි ප්‍රකාශ කළේ ය. මෙම බලවේගය ව්‍යාප්ත කිරීමේ වගකීම

ඉංග්‍රීසින්ගෙන් පැවරුණේ හජ්ජි මුහන්දිරම්ට ය. ඔහු රාජ්‍යත්වයේ භාරකාරත්වයට ඉදිරිපත් වුණු එම දොරේ සාමි ඇල්ලීමට සේනාව සමඟ පිටත් වුවත් සිංහල සේනාවට මුහුණදීමට නොහැකිව පලා ගියේ ය. එනයින් ඉංග්‍රීසින්ගේ පළමු ප්‍රයත්නය අසාර්ථක වූ බව පෙනේ. ඒ අනුව නැවත බදුල්ලේ දිසාපති වූ විල්සන් සහ ලුතිනන් නිව්ටන් යටතේ භට හමුදාවක් ඌව බලා පිටත්ව ගියහ. ඔවුහු ඉනාමලුව ප්‍රදේශයේ කැරලිකරුවන් නොසිටි නිසා බින්තැන්න බලා ගමන් ආරම්භ කළහ. **බූටාවේ රටේරාල** ළඟ හජ්ජි මුහන්දිරම් සිර කර සිටින බව දැනගත් විල්සන්, බින්තැන්න බලා පිටත් වී ඇත. නමුත් හජ්ජි මරික්කාර් හා විල්සන් යන දෙදෙනා ම ඝාතනය කිරීමට කැරලිකරුවන්ට හැකි විය. ඉංග්‍රීසි ආණ්ඩුව මෙවැනි තත්ත්වයක් අපේක්ෂා කළේ නැත. තව ද ඒ හේතුවෙන් ඔවුහු ඉමහත් කලබලයට පත් වූ බව පෙනේ. ජාතික කැක්කුමෙන් යුතුව පෙළ ගැසෙමින් සිට සිංහල සේනාව රොබට් බ්‍රවුන්රිග් හැඳින්වූයේ වැද්දන් හෙවත් වනචාරීන් වශයෙනි. මෙම අරගලය සම්බන්ධ බ්‍රිතාන්‍ය තැතිගැන්ම කොතරම් ද යන්න එයින් වටහා ගත හැකි ය. මුල් මාස හතර සහ පහ තුළ දී ඌවට පමණක් සීමා වූ එම ජාතික සටන් ව්‍යාපාරය උඩරට සෙසු පළාත්වල ද පැතිර යාම වැළැක්වීමට ඉංග්‍රීසීහු ගනු ලැබූ සියලු ප්‍රයත්න අසාර්ථක විය.

ඌවේ විමුක්ති සටන ඉක්මනින් පාලනය කිරීමට බ්‍රිතාන්‍ය හමුදාව අපොහොසත් වීම එම අරගලය තදින් ව්‍යාප්ත වීමට හේතු විය. තම දේශහිතෛෂී අභිමතාර්ථ සාධනය කර ගැනීම සඳහා සිංහලයෝ ඒකාවන්ව පෙළ ගැසුණෝ ය. අවශේෂ ප්‍රදේශවල නායකයින් හා මහජනයා ද කැරැල්ලට එක් වූහ. ක්‍රි.ව. 1818 පෙබරවාරි වන විට මෙම අරගලය දුම්බර, හේවාහැට, හත් කෝරළේ, හාරිස්පත්තුව, මාතලේ සබරගමුව, නුවරකලාවිය යන ප්‍රදේශවල ද තදින් පැතිර ගියේ ය. මෙම කැරැල්ලේ පැවති විශේෂත්වයක් වූයේ ඒ ඒ ප්‍රදේශවල නායකයින් වටා ජනතාව ඒකරාශී වීමයි. ප්‍රධාන වශයෙන් **මඩුගල්ලේ උඩ ගබඩාවේ නිලමේ** යටතේ දුම්බර හා තුම්පනේ කැරලි ගැසූ අතර **පිළිමතලව්වේ මහ අදිකාරම** කැරැල්ලට එක් වීමත් සමඟ හත් කෝරළයේ දී එය පැතිර ගියේ ය. අවසානයේ දී මෙම අරගලය පැතිර නොගියේ උඩුනුවර, යටිනුවර, හත් කෝරළේ හා සබරගමුවේ කොටසක් තුළ පමණි. ඇතිවන තත්ත්වය පාලනය නොකළහොත් නොබෝ දිනකින් බොහෝ පරාජ රැසක් අත්විඳීමට සිදුවන බව ඉංග්‍රීසීහු දැන සිටියෝ ය. එම නිසා ඌවේ කැරලිකාර තත්ත්වය මර්දනය කිරීමට ඉංග්‍රිසි ආණ්ඩුකාරවරයා වහා පියවර ගත්තේ ය. ඒ අනුව වෙල්ලස්ස හා බින්තැන්න දිසාව, ඌව දිසාව සහ වලපනේ දිසාව යන ඉංග්‍රීසින්ට පක්ෂපාත නිලධාරීන් තිදෙනාට ස්වකීය දිසාවන්ට ගොස් උද්ගතව ඇති නොසන්සුන්කාරී තත්ත්වය මර්දනය කරන ලෙස ආණ්ඩුකාරවරයා නියෝග කළේ ය. ඒ අනුව විවිධ නායකයන් යටතේ හමුදා සේනාංක කිහිපයක් වෙල්ලස්ස බලා පිටත් විය. ක්‍රි.ව. 1817 සැප්තැම්බර් 18 වන දින බින්තැන්නට හමුදා සේනාංකයක් යැවී ය. ක්‍රි.ව. 1817 සැප්තැම්බර් 21 දින තවත් සේනාංකයක් වෙල්ලස්සට යැවී ය. එම මස 22 වන දින මොනරවිල කැප්පෙටිපොළ බදුල්ල බලා ගමන් ගත් අතර ජෝන් ඩොයිලි යටතේ ද සේනාවක් හඟුරන්කෙත හරහා බදුල්ලට පිටත් වුණි. මඩකලපුවෙන් හා ත්‍රිකුණාමලයෙන් ද අතිරේක සේනා පැමිණියේ ය. මේ අයුරෙන් විශාල බලඇණි සිංහල සටන මර්දනය කිරීමට සන්නද්ධ වූ බව පෙනේ.

## ජාතිය වෙනුවෙන් ගත් අභීත තීරණය

බ්‍රිතාන්‍ය පාලකයන්  වීර කැප්පෙටිපොල පිළිබඳ විශාල විශ්වාසයක් තබා සිටි අතර ඔහු සටනට යැවීමෙන් අපේක්ෂා කළේ නිදහස් අරගලය පහසුවෙන් මර්දනය කිරීම ය. එහෙත් ඉංග්‍රීසීන්ගේ අපේක්ෂිත පරමාර්ථ ගඟට කැපූ ඉනි මෙන් බිඳ වැටුණේ කැප්පෙටිපොල සෙන්පතියා කැරලිකරුවන් සමඟ එක් වීමෙනි. කැරලිකරුවන් දළදා වහන්සේ තමන් සතු කර ගැනීමත් සමඟ සියල්ල වෙනස් විය. දන්ත ධාතූන් වහන්සේ යනු මෙරට රාජ්‍යත්වයේ සංකේතයයි. අරත්තන දී සිදු වූ ඓතිහාසික සිදු වීම බ්‍රිතාන්‍ය අධිරාජ්‍ය පාලනයට එරෙහිව පෙළ ගැසීමේ තීරණාත්මක අවස්ථාවකි. කැප්පෙටිපොළගේ පුනරාගමනයත් සමඟ කැරැල්ලට සහභාගි වූ සෙසු නායකයින් සහ ජනතාව අතර විශාල ප්‍රබෝධයක් ඇති විය. ඉංග්‍රීසීන්ට හිතවත්ව මොල්ලිගොඩ ක්‍රියා කළත් **මඩුගල්ලේ, මිල්ලෑව සහ කොබ්බෑකඩුවේ** යන නායකයෝ ද අරගලයට ජීවය දුන්නෝ ය. කැප්පෙට්ටිපොල අදිකාරම්ගේ චරිතය පුරාවට ම දිවෙන්නේ ඔහු කුඩා කල සිට ම ප්‍රගුණ කළ දේශමාමකත්වයයි. ඉංග්‍රීසින් යටතේ සිට පසුව සත්‍යාවබෝධ වී දේශිය විමුක්ති අරගලයට පණ පොවමින්, ඉංග්‍රීසින්ගේ අවි ආපසු භාරදීමේදීත්, සතුරා අබියස අභීතව ගැටී ජීවිතය වෙනුවට මරණය තෝරා ගැනීමේ දීත් එය කැපී පෙනෙයි. **කිවුලෙ ගෙදර මොහොට්ටාල, බූටෑවේ රාල, කොහොකුඹුරේ රටේරාල** වැනි දේශ හිතෛශීන්ගේ මූලිකත්වයෙන් විමුක්ති අරගලය ඇරඹුණි.

දේශානුරාගය, ජාත්‍යනුරාගය තුළින් ගොඩනගාගත් කැප්පෙට්ටිපොල අදිකාරම්ගේ වීරත්ව චෛතසිකයන් පිළිබඳ සාධාරණ අදහසක් ඔහුගේ පහත ප්‍රකාශය තුළින් ද ලබාගත හැකි වේ.

"මා හිතවත් සහෝදරවරුනි, රටට ජාතියට හා ආගමට මගේ ඇති ආදරය හා ගෞරවය ඔබ තුළ පවත්නා භක්තියට දෙවෙනි නොවේ. මා මේ ගමන ආවේ ද සතුටින් නොවේ. ඒ අතර වාරේ මා පැමිණියේ සිතින් දහස්වර දුක් විඳිමිනි. එසේ එමින් මා තීරණයක් ගතිමි. එම තීරණය නම් දේශයේ නිදහස උදෙසා සටන් කරන ඔබ සමඟ මා ද එකතු වීමයි."



**ඡායාරූප අංක 6- මාතලේ පල්ලේපොළ වේළුවනාරාමයේ සිතුවම් කර ඇති කැප්පෙටිපොල දිසාවේ ලෙස හඳුනාගෙන ඇති සිතුවම (ක්‍රි. ව. 1859)**




**ඡායාරූප අංක 7- කැප්පෙටිපොල දිසාවේගේ හිස් කබල පිළිබඳ පුවත්පත් වාර්තාකරණ**

භූමියේ වාසිය උපරිම ප්‍රයෝජනයට ගත් අරගලකරුවන් වඩාත් සාර්ථක විය. ඒ වන විට ලංකාවේ ඉංග්‍රීසි සේනාවේ සිටියේ ස්වල්ප දෙනෙකි. යුද උපකරණ සහ භාණ්ඩ සැපයීමට ප්‍රමාණවත් පරිදි අතවැසි

සේනාවක් ද නොවීය. දේශගුණික වශයෙන් ගංගා ඇළ දොළ පිටාර ගැනීමත් සමග කොළඹ සහ මහනුවර අතර සියලු සබඳතා අඩාළ විය. කැප්පෙටිපොල කැරලිකරුවන්ට එක් වීම ද තත්ත්වය ඉංග්‍රීසින්ට තවත් අවාසිදායක විය. මෙම හේතු නිසා අරගලය සංවිධානාත්මක ලෙස ව්‍යාප්තව ප්‍රශ්නය සංකීර්ණ වෙතැයි රොබට් බ්‍රවුන්රිග් තුළ දැඩි බියක් හට ගත්තේ ය. ක්‍රි.ව. 1817 නොවැම්බර් මස 01 වන දින විට ඌව දිසාවේ බලය දිනා ගැනීමට කැරලිකරුවන්ට හැකි විය. තම පසුබැසීම වළකා ගැනීමට නම් අතිරේක සේනා ලබා ගැනීම ඉංග්‍රීසීන්ට අත්‍යවශ්‍ය විය. ආණ්ඩුකාරවරයාගේ ඉල්ලීම පරිදි බෙංගාලයෙන් සහ මදුරාසියෙන් ආධාරක සේනා පැමිණියහ. ක්‍රි.ව. 1818 ජූලි මාසයේ දී හේවායින් 5200ක් පමණ කැරලි කරුවන්ට විරුද්ධ ව මෙහෙයවීමට ආණ්ඩුකාරවරයාට හැකි විය. වෙල්ලස්සට සේනාංක පැමිණෙන විට ජනතාව කැළෑ වැදුණහ. කාර්යක්ෂමව සන්නිවේදනයක් ඇති කිරීමේ අරමුණින් කොටබෝව නම් මුස්ලිම් ග්‍රාමයේ ප්‍රධාන මධ්‍යස්ථානයක් ඉංග්‍රීසිහු ආරම්භ කළේ ය. වඩා ශක්තිමත්ව පැමිණි බ්‍රිතාන්‍යයෝ සරුසාර ගම් බිම් විනාශ කර සාමාන්‍ය ජනතාව අසරණභාවයට පත් කළහ. එසේ විනාශයට ලක් වූ ගම් අතර උස්නවැල්ල ප්‍රධාන වේ. ගම්මානය ගිනිබත් කොට එහි සිටි ගවයන් රංචු පිටින් පුළුස්සා ආහාර ලෙස ගැනීමට තරම් හේවායෝ ම්ලේච්ඡ වූහ. ඉංග්‍රීසීන් බොහෝ යටත්විජිතවල තම ආධිපත්‍ය ස්ථාපිත කරගැනීමේ දී මෙවැනි සාහසික ක්‍රියාමාර්ග අනුගමනය කර ඇත. ඔවුන් රෑ මුරකරුවාගේ න්‍යාය (අල්ලා ගත් යටත්විජිත සමාජ ආරක්ෂා කරන ලොවට පෙන්වුව ද සම්මත සිරිත් කඩ කරමින් කුරිරු ලෙස කටයුතු කිරීම) ක්‍රියාත්මක කළ බව මේ අනුව පැහැදිලි වෙයි. මෙම පහත් සිදු වීම් හේතුවෙන් සිංහලයෝ තව තවත් අධිෂ්ඨානයෙන් යුතුව සටනට සැරසුණහ. ක්‍රි.ව.1818 නොවැම්බර් 21 වන විට බදුල්ලේ බලය ද සිංහලයන්ට නතු විය. කැප්පෙටිපොළගේ නායකත්වය යටතේ බදුල්ලට ළඟා විය හැකි සෑම මාර්ගයක් ම කැරලිකරුවන්ගේ පාලනයට නතු විය. ඔවුහු සැපයුම් මාර්ග සීමා කිරීමත් සමග ඉංග්‍රීසීහු අසරණ විය.

## අපටත් රජෙක්

මෙම ක්‍රියා මාර්ග ඔස්සේ අරගලය තීරණාත්මක සන්ධිස්ථානයකට පත් ව තිබුණි. රජෙකු අභිෂේක ලැබීම වැසියන්ගේ ප්‍රීතියට සහ චිත්ත ධෛර්ය වර්ධනයට සෘජුව බලපානු ලබයි. ඒ අනුව ලැබූ ජයග්‍රහණවලින් උද්දාමයට පත් වූ සිංහල සේනාව විසින් අභිෂේක උත්සවයක් පවත්වන ලදි. රාජ්‍යත්වයට උරුමකම් කී දොරේ සාමිගේ අභිෂේක ගැන්වීමේ උත්සවය වෙල්ලස්සේ දියබෙත්මේ අලුත්වල නම් ග්‍රාමයේ දී සිදු විය. අභිෂේකයට අවශ්‍ය මාලිගයක් සහ මඟුල් මඩුවක් යනාදී දෑ ඉදි කිරීමේ වගකීම් කැප්පෙටිපොල නිලමේ හට භාර විය. ඊට අදාළ සියලු කටයුතු සම්පාදනය කර සෑම දිසාවක් ම භාර සිංහල නායකයෝ ස්වකීය දිසාවට අයත් කොඩියත් සේනාවත් රැගෙන එන ලෙස දන්වා සිටියෝ ය. ඊට පසු දින විශාල පිරිසක් රාජභිෂේකයට පැමිණ සිටියහ. උත්කර්ෂවත් ලෙස මෙම උත්සවය පවත්වා ඇත. රජු අභිෂේක වීමෙන් පසු මහාදිකාරම් ලෙස මොනරවිල කැප්පෙටිපොල පත්ව තිබේ. අනිකුත් දිසාවේවරු, මොහොට්ටාලවරු සහ රටේරාලවරු ඇතුළු සෙසු තාන්නමාන්න ද පිරිනැමිණ. එපමණක් නොව ඒ ඒ දිසාව වෙනුවෙන් පෙනී සිටීමට ද විවිධ ප්‍රභූ පිරිස මඟුල් මඩුවට

ඒකරාශී වී සිටියහ. මෙම අභිෂේකය පිළිබඳ ආරංචිය ගම් නියම් ගම් පුරා පැතිර ගියේ ය. ඒ මගින් සිංහලයාගේ ජාතික චින්තනය වර්ධනය විය. ඒ සියල්ලෝ ම අපගේ ජාතික වීරයෝ වූහ. ඒ පුවත සමඟ තව තවත් කැරලිකරුවෝ විරෝදාර ලෙස සටනට පෙළ ගැසුණහ. මෙම ආරංචිය පැතිරෙත්ම ඉංග්‍රීසීන් මහත් භීතියට සහ කලබලයට පත් විය. අභිෂේකය පවත්වා රජතුමා ඇතුළු පිරිස කොත්මලේ බලා පිටත් වූහ. තමන්ට රජෙකු සිටින බව හඳුනා ගත් සිංහලයෝ තිර අධිෂ්ඨානයෙන් විජයග්‍රහණය පිණිස කටයුතු කළෝ ය.

මේ වන විට පළමුවැනි නිදහස් අරගලය සංවිධානාත්මකව පැතිර යන බව බ්‍රවුන්රිග් ආණ්ඩුකාරවරයාට දැන ගන්නට ලැබුණි. ඒ අනුව හෙතෙම මහනුවර මඟුල් මඩුවට රදළ නායකයින් කැඳවා ඔවුන්ට තර්ජනාත්මක ස්වරූපයෙන් ආමන්ත්‍රණය කළේ ය. සියලු රදළවරු ඊට සහය නොදී සිටිය යුතු බව ද පෙන්වා දුන්නේ ය. එවිට නිහඬව සිටි රදළවරුන් මෙම කැරැල්ල පහත් පන්තිවල ක්‍රියාවකැයි පවසමින් ජලයෙන් තනාගන්නා ලුණු ජලයෙන් ම දියව යන බව කියමින් මෙය ඉක්මනින් සන්සිඳී යන බව පෙන්වා දුන්නහ. නමුත් මෙම අදහස පිළිනොගත් ආණ්ඩුකාරවරයා ඉදිරි කාලය තුළ සූදානමෙන් සිටින ලෙස සේනාංකවලට නියෝග කළේ ය. ඉංග්‍රීසීහු කැරැල්ල මර්දනයට දැඩි ප්‍රතිපත්ති අනුගමනය කළෝ ය. රාජාභිෂේකයෙන් පසු පිටත්ව ගිය සිංහල නායකයෝ සෑම ප්‍රදේශයකම දරුණු ලෙස සටන් ආරම්භ කළහ. කලින් වෙල්ලස්ස, ඌව සහ වලපනේට පමණක් සීමා වූ සිංහල විමුක්ති අරගලය මාතලේ, දුම්බර. උඩුනුවර, යටිනුවර, තුන්පනේ, හාරිස්පත්තුව යනාදී සෑම ප්‍රදේශයක ම පැතිර ගියේ ය. කැරැල්ල මර්දනයට නම් කැරලි නායකයන් සිරභාරයට ගත යුතුය. කැරලි නායකයෙකුගේ හිස ලබා දුන් කෙනෙකුට රික්ස් ඩොලර් 2000ක් ද කැරැල්ලට සම්බන්ධ දමිළ ජාතිකයෙකු ගේ හෝ කිවුලේගෙදර මොහොට්ටාල හෝ බූටැවේ රටේරාල වැන්නන්ගේ හිස් ගෙනැවිත් දුනහොත් රික්ස් ඩොලර් 500ක් දෙන බවට ද ක්‍රි.ව. 1817 නොවැම්බර් 06 වෙනිදා ඉංග්‍රීසි රජය ප්‍රකාශයට පත් කළේ ය. රටේ වාතාවරණය දරුණු අතට පත්වීමත් සමඟ ආණ්ඩුකාරවරයා දෙබිඩි පිළිවෙතක් අනුගමනය කර ඇත. අරගලය අතහැර පැමිණි මුලාදෑනින්ට දඬුවම් ලබා නොදී සමාව ලබා දී මධ්‍යස්ථ ප්‍රභූන්ගේ සිත් දිනා ගත්තේ ය. ඉන් නොනැවතුණ හෙතෙම ක්‍රි.ව. 1818 ජනවාරි නිවේදනයකින් කැප්පෙටිපොළ ඇතුළු නායකයින් දාහත් දෙනෙකු ඔවුන් දැරූ තනතුරුවලින් සහ දේපලවලින් නෙරපා දැම්මේ ය.

කැරලිකරුවන්ගේ සෑම උපක්‍රමයක් ම දේශීය ඔත්තුකරුවන්ගෙන් ඉංග්‍රීසිහු ලබා ගැනිණ. ප්‍රධාන වශයෙන් වෙළෙඳුන් ලෙස බොහෝ ප්‍රදේශවල සැරිසැරූ මුස්ලිම්වරු වාසි අපේක්ෂාවෙන් ඉංග්‍රිසීන්ට තොරතුරු සැපයූහ. එනිසා කැරලිකරුවන්ගේ බොහෝ රහස්‍ය තොරතුරු අනාවරණය කර ගැනීමට හැකි විය. ඒවා මනාව අධ්‍යයනය කළ මැක්ඩොනල්ඩ් ඔවුන්ව මර්දනය කිරීමට දැඩි පිළිවෙතක් ගෙන ගියේ ය. ඌවේ කැරලිකරුවෝ කුසගින්න සහ වෙඩි උණ්ඩය තුළ අතරමං වූ ජීවිතයක් ගත කළහ. මෙම භයංකාර තත්ත්වයට මුහුණ පෑ කැරලිකරුවෝ සිය නායකයින්ගේ අණට අකීකරුව සටන් බිමෙන් ඉවත් කිරීමට මැක්ඩොනල් විසින් පියවර ගත්තෝ ය. ඉන් නොනැවතී ජනතාවගේ බඩට පහර දීමට ඉංග්‍රිසීහු පියවර ගත්හ. සටන මැඩලීමට නම් ගම් බිම් විනාශ කිරීම අවශ්‍ය විය. මැක්ඩොනල් යටතේ ඌව ප්‍රදේශයට පැමිණි ඉංග්‍රීසි හේවායෝ සිංහලයින් මරා දැමූහ. මෙම හේවායෝ ගොවිතැන් කිරීමට ජලය

ලබා ගත් වාරිමාර්ග විනාශ කර, අතිරේක ආහාරපාන සැපයූ ගහ කොළ ද කපා දැමූහ. අවසානයේ ස්වදේශිකයෝ මහත් දුර්භික්ෂයකට මුහුණ දුන්හ. ආහාර ප්‍රශ්නය උග්‍ර වීමත් සමග කැරලිකරුවන්ගෙන් ආත්ම විශ්වාසයෙන් හීන වූ අතර ඔවුහු ලෙඩ දුකින් පෙළෙන්නට වූහ. මෙය ඉංග්‍රීසීන්ගේ වාසියට හේතු විය. ඉංග්‍රිසි භටයින්ට සටන් මෙහෙය වීමේ දී ආහාර පාන සහ සෙසු අවශ්‍යතා මොල්ලිගොඩ විසින් සැපයූව ද සිංහලයින්ගේ අවශ්‍යතා සපුරාලීමට කිසිවෙක් නොවීය.

## පසුබැස්සට නොසැලුණු ජාතිය

මෙම අරගලය ක්‍රියාත්මක වීමේ දී හතර කෝරළේ, හත් කෝරළේ, දුම්බර සහ මාතලේ බ්‍රිතාන්‍යයන්ට විරුද්ධව බලසම්පන්න පෙරමුණු හතරක් සංවිධානය විය. එනමුත් ඉංග්‍රීසිහු කපටි බුද්ධිය සහ කුට උපක්‍රම යොදා කැරලිකරුවන්ගේ ශක්තිය බෙලහීන කිරීමට පියවර ගත්තෝ ය. මේ නිසා යුද පෙරමුණේ විශාල පසුබැසීමක් ඇති විය. රොබට් බවුන්රිග් කෙසේ හෝ දළදා වහන්සේ ආපසු ලබා ගැනීමට නැවත කල්පනා කළේ ය. සේනාංක කිහිපයක් කැරලිකරුවන් මර්දනය කිරීමට විසිරී ගියහ. හත් කෝරළය, තුම්පනේට, වෙල්ලස්සට, දුම්බරට, රුවන්වැල්ලට, කුරුණෑගලට ඉංග්‍රීසි සේනාංක පිටත් ව ගියහ. සිත් පිත් නොමැතිව ලොකු පොඩි සැම දෙනාම විනාශ කිරීමට තරම් ඔවුහු කුරිරු වූහ. සිංහලයාගේ චිත්ත ධෛර්ය බිඳවීමට ජෝන් ඩොයිලි කල්පනා කළේ ය. ඒ අනුව සිංහලයන් ඒකරාශී වී සිටින්නේ සැබෑ නායක්කාර් උරුමකරුවෙකු නොවන බවට ප්‍රචාරය කරවන ලදි. මේ සඳහා ඔහුට උපකාර කර ඇත්තේ උඩගම හිමියන් විසින් බවට සඳහන් වේ. එම හිමියන් ගේ පාවාදීම අරගලයේ ගමන් මග වෙනස් කිරීමට ඍජුව ම බලපෑවේ ය. ජනතාව පමණක් නොව නායකයින් තුළ ද විශාල පසුබැස්මක් එනිසා ඇති වී ඇත.

ඌව වෙල්ලස්ස ජාතික විමුක්ති සටන් ව්‍යාපාරය වෙනුවෙන් දිවි පිදූ මොනරවිල කැප්පෙට්ටිපොල අදිකාරම් ප්‍රමුඛ ප්‍රධාන සටන්කාමීන්ට සමානව ඉතා නිර්භීත අයුරින් අරගලය මෙහෙය වූ ප්‍රාදේශීය වීරයන් රැසක් ද හඳුනාගත හැකි ය. එවන් ප්‍රාදේශිය වීරවරයන්ට ශ්‍රී ලාංකේය ඉතිහාස සම්ප්‍රදාය තුළ නිසි ගෞරවය පුද ලැබෙන්නේ ද යන්න ගැටලුවකි. ඉසිලිය නොහැකි බදු බරත්, අමානුෂිය පරිපාලනයක්, ඉවසාගත නොහී විමුක්තිය උදෙසා සටන් කළ ප්‍රාදේශීය නායකයන් තුළ ද පැවතියේ සැබෑ දේශප්‍රේමියත්වයයි. ඉංග්‍රීසි යුද්ධාධිකරණය මගින් මරණ දඬුවම ලබාගත් මඩුල්ලේ පුංචිරාල, මඩුල්ලේ අරුමා, බලංගොඩ, කිංචිමැනිකා දුරයා ද, බදුල්ලේ කිරිනයිදා දුරයා, පරණගම කිරිනයිදා දුරයා, රාහුපොළ පිහින රාල, මීගහපිටිය රටේරාල වැන්නන් ද සිංහලයේ විමුක්තිය උදෙසා දිවි පිදූ විමුක්තිකාමීන් ලෙස ගෞරවාන්විත තැනක පිහිටවිය යුතුය. ඔවුන් ගැන වත්මන් පරපුර දැනුම්වත් කළ යුතුය. එම සංග්‍රාමය පරාජය කිරීමෙන් පසු ඉංග්‍රිසින් විසින් මුරිසි දිවයිනට පිටමං කිරීමට තීරණය කළ යටිනුවර, පිළිමතලාවේ දිසාව, මත්තමගොඩ තුන්කෝරළේ දිසාව, දෙමෝදර මොහොට්ටිලා, කොහුකුඹුරේ රටේරාල වැනි වීරයන් රැසක් සිරකරුවන් ලෙසම මරණය ළඟා කර ගෙන තිබේ. ප්‍රකට වුවත්, අප්‍රකට වුවත් ඔවුහු සියල්ල ම විමුක්ති අරගලයක් වෙනුවෙන් අවසන් හුස්ම පොද කැප කළ

සැබෑ වීරවරයෝ ය. ඒ නිසා මේ සියල්ලන්ට ම ජාතියේ ප්‍රණාමය හිමිවිය යුතුය. අපගේ වන්දනීයත්වයට සදා පත්විය යුත්තෝ ය.

## ජාතික විමුක්තිය යළි උදාව


බ්‍රිතාන්‍ය පාලනයට එරෙහිව දියත් වූ දෙවන නිදහස් සටන වන්නේ පුරන් අප්පු, ගොංගාලේගොඩ බණ්ඩා හා හඟුරන්කෙත ඩිංගිරාල නායකත්වය දුන් ක්‍රි.ව. 1848 දී ඇති වූ සටන ය. ක්‍රි.ව. 1818 න් පසුව ද බ්‍රිතාන්‍ය රජය විසින් මුලින් ඇතිවූ කැරලිවලින් පාඩමක් උගත් බව නොපෙනේ. ඉන් පසුත් බ්‍රිතාන්‍ය අධිරාජ්‍යවාදීහු තම දේශපාලන, ආගමික, සංකල්ප හා න්‍යාය මෙරටෙහි ක්‍රියාත්මක කරන්නට විය. මෙපමණ කාලයක් තමන් විසින් උරුම කොටගත් සංස්කෘතියෙහි පැවැත්මට බාධා එල්ල වීමත් සමඟ එයට එරෙහි විරෝධතා ඇති වේ. එහි ප්‍රතිඵලයක් ලෙස 19 වන සියවසේ දෙවන භාගය වනතෙක්ම නොයෙක් අරගල ඇතිවන්නට විය. ඒවායේ විශේෂත්වය වන්නේ භික්ෂූන් වහන්සේලා ගේ නායකත්වය කැපී පෙනීමයි. ක්‍රි.ව. 1822 වන විට මාතලේ දී සටනක් ඇති විය. එහි නායකත්වය කහවත්තේ හිමියන් විසින් ගනු ලැබී ය. ක්‍රි.ව. 1834 දී නව සටන් ඇති වුවත් එහි සාර්ථකභාවයක් ඇති නොවීය. ක්‍රි.ව. 1842-1843 කාලයේ දී උඩුදුම්බර ප්‍රදේශයේ රාජ ප්‍රතිරූපකයකු සැරිසරන බවත්, එවකට ආණ්ඩුකාරතුමා වූ කෝලින් කැම්බල්ට දැන ගත්තේ ය. වහා කියාත්මක වූ රජය රාජද්‍රෝහී චෝදනා පිට කිහිප දෙනකු අත් අඩංගුවට ගත්හ. ඒ අතර, දිනීස්, ඩෙවිඩ්, ඩිංගිරාල සහ චන්ද්‍රගුප්ත යන නායකයින් හතරදෙනෙක් නඩු විභාගය සඳහා මහනුවරට රැගෙන ආව ද ඔවුන්ට එරෙහි චෝදනා ඔප්පු කිරීමට බැරි වූ නිසා නිදහස් කළහ. මේ අතරතුර කොත්මලේ සහ ඌව ප්‍රදේශවල රජයට විරුද්ධව උසිගැන්වීම් දිගට ම සිදු විය. ක්‍රි.ව. 1843 වනවිට ගොන්ගාලේගොඩ බණ්ඩාගේ සොහොයුරකු වූ දීනිස් චෝදනා පිට අත් අඩංගුවට ගත්තේ ය. මේ ආකාරයට ක්‍රි.ව. 1843 දක්වා නොයෙක් ආකාරයට අධිරාජ්‍ය පාලනයට එරෙහිව ජනතාව පෙළ ගැසුණ ද ඒවායේ එතරම් සාර්ථකභාවයක් දක්නට නොවීය.


දෙවන නිදහස් අරගලය ඇතවීම සඳහා සෘජු වශයෙන් ක්‍රි.ව. 1848 දී ටොරින්ටන් සාමිවරයා විසින් පනවන ලද බදු හේතු වූවත් දිර්ඝකාලීනව මෙරට සමාජයේ ගොඩනැගුණු අධිරාජ්‍ය විරෝධී හේතු සාධක බලපෑවේ ය. ඒ අතුරින් ක්‍රි.ව. 1815 ගිවිසුම් වගන්ති කඩවීම හා ක්‍රි.ව. 1833 දී මෙරට ඇති කළ කෝල්බෲක්, කැමරන් ප්‍රතිංස්කරණවල ඇතැම් අහිතකර තත්ත්වයන් ද දැක්විය හැකි ය. ක්‍රි.ව. 1833 දී ඇතිකරන ලද නව ප්‍රතිසංස්කරණ හේතුකොටගෙන සමාජීය, ආර්ථික හා දේශපාලනික වශයෙන් දැඩි විපරිවර්තනයක් ඇති විය. එනිසා මෙතෙක් පැවැති සාම්ප්‍රදායික අර්ථික රටාව බිඳවැටී ධනවාදී අර්ථික ක්‍රමය ගොඩනැගීමට පසුබිම් සැකසීමට අවශ්‍ය යෝජනා ඉදිරිපත් විය. වැඩවසම් ආර්ථික ක්‍රමයකට හුරු වී සිටි ජනතාව වතු වගාව උඩරට ප්‍රදේශවල පැතිර යාම නිසා අතරමං වූහ. චිරාත්කාලයක් සිට මෙරට ජනතාව රාජකාරි සේවාව මත රදලවරයකුට හෝ විහාර දේවාලයකට රාජකාරිය ඉටු කිරීම නිසා ඉඩම් ලබා ගැනීමට හැකි විය. එහෙත් රාජකාරි සේවාව අතහැර වතුවගා ක්‍රමයකට ජනතාව යොමු කිරීමත් සමඟ මෙතෙක් කල් ඔවුනට උරුමව පැවති ඉඩම්වල අයිතිය ක්‍රමයෙන් ගිලිහිණ. ඒ සඳහා බ්‍රිතාන්‍යයන් විසින් නව නිතී සම්පාදනය කිරීමත් සමඟ ජනතාවගේ ඉඩම්වල අයිතිය පිළිබඳ ව නොයෙක් අර්බුද


මතුවන්නට විය. උඩරට ප්‍රදේශවල වතු වගාව සඳහා පහසුකම් සැලසීමට ක්‍රියාකළ බ්‍රිතාන්‍ය රජය උඩරැටියා විසින් පෙර භුක්තවිඳි ඉඩම් පෞද්ගලිකව අයිතිය පැවරෙන ආකාරයේ පනත් පනවන ලදී. 1840 අංක 5 දරණ ඉඩම් පනත හා 1840 අංක 12 දරණ පනත මේ බවට කදිම සාක්ෂ්‍ය වේ. මෙම පනත මගින් අයිතියක් නොමැති සියලු ම ඉඩම් වැවිලි කටයුතු සඳහා ලබාගැනීමට හැකි විය. මෙසේ රාජසන්තක කළ ඉඩම් අක්කරය සිලිං පහ බැගින් යුරෝපිය වැවිලිකරුවන්ට විකුණන ලදි. වතු වගාවට ගැමියන්ගේ ඉඩම් කොටුවීමත් සමඟ මෙතෙක් ගැමියන් භුක්ති විඳින ලද නිදහස අහිමිවිය. හේන් ගොවිතැන විනාශ වීම, ගවයන් ඇති කිරීමට ඇති ඉඩ ඇහිරීම, පහත් ප්‍රදේශ වතු වගාව නිසා නිසරු වීම ආදි ප්‍රශ්න රාශියකට ගැමි ජනතාව මුහුණ දුන්නේ ය. වතු වගාව ආරම්භ කිරීමත් සමඟ මෙතෙක් බ්‍රිතාන්‍යයන් කෘෂි කර්මාන්තය කෙරෙහි දැක්වූ අවධානය අඩු වී කෘෂි කටයුතු අතපසු වේ. වාරිමාර්ග කටයුතු ප්‍රතිසංස්කරණය නොකිරීමත්, ඇළ වේලි නඩත්තුව අතපසු කිරීමත් නිසා ගැමියා තව තවත්, පිඩනයට පත්විය. එබැවින් ගැමියාගේ පීඩනය වැඩි වී බ්‍රිතාන්‍ය රජය කෙරෙහි කලකිරීම තවදුරටත් වර්ධනය වීම සිදු විය. පරම්පාරා ගණනක්ම ඉඩකඩම් නිසා ම සිය ජිවිතය ගෙනයමින් ඒවා කෙරෙහි අතිශයින් බැඳී සිටි ගම්වැසියා තමා අවට තිබූ ප්‍රදේශ පිටරැටියන්ට අයත්වීම ගැන දැඩි කලකිරීමට පත් වූහ. වැවිලි කටයුතු ව්‍යාප්ත විමත් සමඟ ගම්වල එක්තරා ප්‍රමාණයක නොසන්සුන්තාවක් ඇති විය. නොයෙක් අංශවල නව රැකී රක්ෂා ආරම්භ වීමත් රජය තැබෑරුම් විවෘත කිරීමට අවසර දීමත් නිසා රටපුරාම මත්පැන් පානය ව්‍යාප්ත වූ බව පෙනේ. උඩරට ප්‍රදේශවල එතෙක් සුරාසැල් ව්‍යාප්ත නොවුණත් ඉතාමත් ශීඝ්‍රයෙන් සුරාවට උඩරට ජනතාව ලොල් වූහ. රජය ආදායම් ලබාගැනීමේ අරමුණින් මෙම කටයුතුවලට අනුග්‍රහය ලබාදුන්න ද ගම්බද ප්‍රදේශවල ඇති වූ දුශ්චරිත පිළිබඳ නිහඬව වගබලා ගැනීමට පාලකයෝ උත්සාහ ගත්හ. කැමරන්ගේ අධිකරණ ප්‍රතිසංස්කරණ සමඟ ඉංග්‍රීසී භාෂාව සහ නීතිය නොදත් ජනයා උසාවි බිමේ අතරමං විය. මුදල් ඉපයිමේ අරමුණින් සහ රජයට වාසි ලබාගැනීම සඳහා ජනතාව නීතිය ඉදිරියේ තබමින් ඔවුන් උපයා ගත් මුදල විනාශ කිරීමට හැකිවිය. වැඩිදෙනෙකු නඩු මඟට බසිනු ලැබුවේ අකටයුත්තක් සම්බන්ධයෙන් සහනයක් ලබාගැනීම උදෙසා නොව පෞද්ගලික එදිරිවාදිකම් පිරිමසා ගැනීම සඳහා ය. මෙබඳු වාද භේද නිසා ගම්වැසියන් අතර දරුණු වෛරයක් ඇතිවීමෙන් ග්‍රාමිය ජිවිතයේ ශාන්තභාවය ද ක්‍රමයෙන් පිරිහීමට පත් විය.


රජය කෙරෙහි ජනතා විරෝධය වඩාත් උග්‍ර වූයේ, බෞද්ධාගම සම්බන්ධයෙන් බ්‍රිතාන්‍යයන් අනුගමනය කළ ප්‍රතිපත්ති නිසා ය. ක්‍රි.ව. 1815 උඩරට ගිවිසුමේ පස්වන වගන්තියෙන් බෞද්ධාගම හා ඊට අයත් විහාර දේවාල නොකඩවා ආරක්ෂා කරන බවට පෙරොන්දු වුව ද මිෂනාරින්ගේ දැඩි ව්‍යාප්තය හමුවේ එම පොරොන්දුව බිඳ වැටිණ. මිෂනාරීන් මිත්‍යා දෘෂ්ටික ආගමක් ලෙස බුද්ධාගම හඳුන්වා එය ආරක්ෂා කිරීම තදින් විවේචනය කර ඇත. එබැවින් අස්ගිරි හා මල්වතු යන උභය විහාරයීය භික්ෂූන්ට හා දියවඩන නිලමේතුමා ඇතුළු කොමිටියට දළදා වහන්සේගේ භාරකාරත්වය පැවරීමත් සමඟ මෙතෙක් රජය හා අගම අතර පැවති සබඳතා බිඳ වැටුණි. භික්ෂූන් පවා නායක තනතුරුවලට පත්කිරීම අත්හැරීමත් සමඟ රටේ ජනතාව ඒ සම්බන්ධයෙන් තදබල විරෝධයක් දක්වන ලදි. චිරාගත සම්ප්‍රදායට

අනුව දළදාවේ හිමිකම් දරණ පුද්ගලයාට රාජ්‍ය බලය හිමිවන බැවින්, සිංහලයෝ නැවතත් රාජ්‍ය බලය ලබාගැනීමේ අරමුණින් කටයුතු සංවිධානය කළහ.









Translation

In compliance with the instructions of Government dated the 7th April 1853

Signed at Kandy this 20 day of May 1853.

**ඡායාරූප අංක 8- ඉංග්‍රීසීන් විසින් දළඳා වහන්සේ නැවත භාරදීම හා සම්බන්ධ දුර්ලභ ලේඛන**

මෙසේ රට අභ්‍යන්තරයේ පැවති තත්ත්වය අතෘප්තිකර වීම සහ ලෝක ආර්ථිකයේ ඇති වූ ආර්ථික, අවපාතයෙන් මිදීම සඳහා එවකට ආණ්ඩුකාරවරයා වූ ටොරින්ටන් සාමිවරයා විසින් මෙරට ජනතාව වෙත සෘජු බදු හතක් පැනවීය. මුද්දර ගාස්තු වැඩිකිරීම, කඩ සාප්පු, බෝට්ටු, රථ වාහන සහ බර කරත්ත අයත් වූවන්ට ඒවා තබාගැනීම පිණිස අවසර පත්‍ර ලබාගැනීම සඳහා වසරකට රන් පවුම බැගින් ගෙවීමට සිදුවිය. තුවක්කුවකට සිලිං 2 1/2ක් ද බල්ලෙකුට සිලිමක් ද ගෙවන ලදි. සෑම පිරිමියෙකුට ම

මාර්ග ප්‍රකෘතිමත් කිරීම සඳහා බද්දක් ගෙවීමට ආණ්ඩුව විසින් නියෝග කරන ලදි. ක්‍රි.ව. 1847 ජූලි මස 6 දින මෙම බදු ක්‍රමයට විරුද්ධත්වය ප්‍රකාශ කරමින් අත්සන් 4000 පමණ පෙත්සමක් ද ජනතාව ඉදිරිපත් කර ඇත. මේ ආකාරයට ක්‍රි.ව. 1846 න් පසුව ඇතිවන නොයෙකුත් පීඩනය නිසා ගැමියන්ගේ ජීවිතය දුෂ්කර විය. රජයට පෙත්සම් ඉදිරිපත් කළ ද විවිධ උද්ඝෝෂණය කළ ද පාලනාධිකාරිය එය ගණන් ගත්තේ නැත.

එහි ප්‍රතිඵලයක් ලෙස කොළඹ හා මහනුවරින් කැරැල්ලක් ආරම්භ වී මාතලේ, දඹුල්ල, වාරියපොල හා කුරුණෑගල යන ප්‍රදේශවල එය ශීඝ්‍ර ලෙස පැතිරිණ. පන්දහසක් පමණ පිරිස මාතලේ රජයේ ගොඩනැගිලි විනාශ කර එහි මුඩුබිම් පනතට සම්බන්ධ ලේඛන විනාශ කළහ. වතු විනාශ කිරීම ද දක්නට ලැබුණි. වාරියපොල කෝපිවතු සහ ගබඩාවන් ද විනාශ විය. කුරුණෑගල කච්චේරියේ සහ උසාවියේ හේන් සහ අනෙක් ඉඩම් වාර්තා ද කොල්ලකන ලදි. උඩරැටියන්ගෙන් ලබාගත් ඉඩම්වල ඔප්පු තිරප්පු ආරක්ෂිතව රඳවා තිබුණේ මෙම ස්ථානවල ය. ජනතාව තමන්ට පීඩනය ඇති වූ ස්ථාන වෙත පහරදීමට පෙළඹුණහ.

## නැවතත් නායකයෙක්

මේ ආකාරයට අරගලය ක්‍රියාත්මක වීමත් සමඟ තවදුරටත් ඒ වටා ජනතාව පෙළ ගැසීම ද වර්ධනය විය. බදු බරින් පීඩාවට පත් ජනතාව අරගල නායකත්වය වටා ඒකරාශී විය. එහි නායකත්වයට ගොන්ගාලේගොඩ බණ්ඩා නායකත්වයට පත් වීම ඒ අතර සිදු විය. මිනිසුන් ඒකරාශී කිරීමට ඔහු සංකේතයක් ලෙස භාවිත වුණ ද මෙම විමුක්ති සටනට නායකත්වය ලබා දුන්නේ භික්ෂූන්වහන්සේලා ය. ක්‍රි.ව. 1818 පළමු නිදහස් අරගලයේ දී මෙන්ම ක්‍රි.ව. 1848 දී ද අභිෂේක උත්සවයක් පවත්වන ලදි. ඒ සඳහා සිංහලයින් තෝරා ගන්නේ දඹුල්ල රාජමහා විහාරය වේ. එම ස්ථානය ජම්බුකොළ ලෙන බ්‍රිතාන්‍ය යුගයේ දී ප්‍රකට වී ඇත. සිංහාසනයට අයිතිවාසිකම් කියූ ගොංගාලේගොඩ බණ්ඩා (පැලියේගොඩ ඩේවිඩ්) පුරන් අප්පු (ප්‍රැන්සිස්) හඟුරන්කෙත ඩිංගිරාල ප්‍රමුඛ සේනාව ක්‍රි.ව. 1848 ජූලි 26 වන දින මෙම විහාරයට පැමිණ ඇත. ඉංග්‍රීසීන්ට තොරතුරු සැපයූ වැව්බැද්දේ ලේකම්ගේ ප්‍රකාශයට අනුව ගොංගාලේගොඩ බණ්ඩා දඹුලු ලෙන් විහාරයට අයත් විහාර මළුවේ දී ක්‍රි.ව. 1848 ජූලි මස 30 දිනට යෙදුණ සුබ මොහෙතෙන් රජු වශයෙන් අභිෂේක ලැබ ඇත. එහි දී අරගලය සඳහා විවිධ තනතුරු නාම පිරිනමා නිලධාරීන් ද පත්කර ඇත. ඒ අනුව හඟුරන්කෙත ඩිංගිරාල හෙවත් වීදිපැල්ලේ බණ්ඩා දුම්බර හාරිස්පත්තුවේ ප්‍රධානියා සහ සත්කෝරළයේ රජු  ලෙස ද පත්කර ඇත. ඔහු රජු ඉදිරියේ දිවුරුම් දී යුවරජු බවට පත් වූ බව වැව්බැද්දේ ලේකම් පවසා ඇත. සේනාව මෙහෙයවීමේ මහ ඇමති ලෙස පුරන් අප්පුත් කරෝ අප්පු සහ දිනීස් සේනාධිනායක තනතුරුත් ලැබීම එදින සිදුව තිබේ. වාර්තා වී ඇති තොරතුරුවලට අනුව දඹුලු විහාරයට එදින 5000ක පමණ පිරිසක් පැමිණ තිබේ. විහාර මළුවේ ඉදිකර තිබූ මණ්ඩපය වෙත භික්ෂූන් වහන්සේලා රැසක් වැඩම කර සිටියහ. අභිනව රජු සඳහා උන්වහන්සේලා පිරිත් දේශනා කළ බවට වාර්තා වේ. මෙම උත්සවයේ දී ප්‍රමුඛ කාර්යභාරයක් දඹුලු විහාරයේ ගිරානගම

හිමියන් විසින් ඉටුකර තිබේ. අවට විහාරස්ථානවලින් භික්ෂූන් වහන්සේලා විශාල පිරිසක් ද මේ අවස්ථාවට වැඩම කළ සිටි බව වැවේබැද්දේ ලේකම් විසින් වාර්තා කරයි.



'රාජාභිෂේකය මොහොතේ දඹුලු ලෙන් විහාර භූමියේ ශබ්ද පූජා නාදය දසත රැව් දී තිබේ. රජු සහ යුවරජු දෝලාවක තබා ප්‍රධාන මාර්ගය ඔස්සේ ලෙනදොර දක්වා ගමන් කළ බවට වාර්තා වේ. මෙම පෙරහැරේ ගමන් කළ සේනා අවි ආයුධ අතැතිව ගොස් තිබේ. කැප්ටන් වොට්සන් මෙම විස්තර සේනාධිනායක කර්නල් ඩ්රාප්ට දන්වා ඇත. ඔහු කොළඹින් ආධාරක සේනා ඉල්ලූ බවට තොරතුරු තිබේ. එදා මෙම අභිෂේකයට බොහෝ පිරිසක් සහභාගි වූ බවට තොරතුරු ඇත. ඒ අනුව මාතලේ දිස්ත්‍රික්කයේ කෝරාළවරු, අතුකෝරාළවරු, රටේමහත්වරු සහ ආරච්චිවරු 84ක් පමණ සහභාගි වී ඇත. මදුරාව කෝරළය, හේවාවිස්ස කෝරළේ සහ අතුකෝරාළ, රටේමහත්වරු, ආරච්චිවරු 25 පමණ ද පැමිණ සිටියහ. මහනුවර ක්‍රි.ව. 1848 ඉංග්‍රීසීන්ට එරෙහිව ඇති වූ අරගලයේ මූලිකත්වය ගන්නේ භික්ෂූන් වහන්සේ බව ජෝන් ඇස්. කොල්පෙෂර් විසින් ක්‍රි.ව. 1848 කොළඹ මහලේකම්ට ලියන ලද ලිපියක සඳහන් කර තිබේ. මෙම කැරැල්ලේ දී දඹුලු පළාතේ මූලිකයා ලෙස ගිරානේගම චන්ද්‍රජෝති හිමියන් ක්‍රියා කර ඇත. මෙම අභිෂේකය පිළිබඳ තොරතුරු සේනාධිනායක ඩ්රාප්ට් විසින් ආණ්ඩුකාරවරයා වෙත වාර්තා කර තිබේ. එහි දී ඔහු ආණ්ඩුකාරවරයාගෙන් ඉල්ලා ඇත්තේ දඹුල්ලේ රාජාභිෂේකයට සහභාගි වූ සිංහලයින් රාජද්‍රෝහීන් ලෙස යුද්ධාධිකරණයට පමුණුවා මරණ දඬුවම ලබාදිය යුතු බවයි. එම අදහස ඒ අකාරයෙන් ම ක්‍රියාත්මක කිරීමට කටයුතු බ්‍රිතාන්‍ය රජය කටයුතු කරන ලදි. ජාතියේ මුරදේවතාව ලෙස භික්ෂූන් වහන්සේගේ මෙහෙවර අති උදාර ය. එය අවබෝධ කරගත් ඉංග්‍රීසීන් උන්වහන්සේලා අකර්මණ්‍ය කිරීම අදහස සමස්ත සමාජයට ලබාදීමේ අරමුණින්, මෙම අරගලයේ ප්‍රමුඛ චරිතයක් වූ කඩහාපොල හෙවත් කුඩාපොල හිමියන් සිවුර පිටින්ම වෙඩි තබා ඝාතනය කරන ලදි. දේශයේ නිවහල්භාවය වෙනුවෙන් භික්ෂූන් වහන්සේ ජීවිතය පූජා කළ අවස්ථා එමට ය. එහෙත් මෙවැනි අවස්ථාවක් සිදුවන්නේ ප්‍රථම වතාවට ය. මෙම නිදහස් සටන ද පරාජයට පත්විය.

## අරමුණ කරා වෙනත් මාර්ග

එසේ හමුදාමය පරාජයට පත් වුව ද ශ්‍රී ලංකාව නිදහස කරා යන ගමනේ දී 1850න් පසු දක්නට ඇත්තේ අරගලකාරී ස්වරූපයකට වඩා ආගමික හා සංස්කෘතික පුනර්ජීවන ව්‍යාපාරයකි. අධිරාජ්‍ය පාලනය නිසා අහිමිව ගිය සංස්කෘතික සහ ආගමික අයිතීන් දිනාගැනීමට පෙළගැසෙමින් බුද්ධිමය කතිකාවතක් ලෙස එම විමුක්ති ව්‍යාපාරය ගොඩනැගුණි. 19 වන සියවස වනවිට යුරෝපයේ විශේෂයෙන්ම එංගලන්තයේ ජන සම්මතවාදී අදහස් පැතිරෙමින් තිබූ හෙයින් පෘතුගීසීන් හා ලන්දේසීන් මෙන්ම දේශීය ආගම් මර්දනය කිරීමේ පිළිවෙතක් ක්‍රියාත්මක කිරීමට ඉංග්‍රීසීන් හට නොහැකි විය. එම තත්ත්වය තුළ යටත්විජිතයන්හි ක්‍රිස්තියානි ආගම ව්‍යාප්ත වූයේ රාජ්‍ය ප්‍රතිපත්තියක් වශයෙන් නොව පෞද්ගලික සංවිධාන විසින් ගෙන යන ලද ව්‍යාපාරයක් ලෙසිනි. මෙම පසුබිමට එරෙහිව සිංහල, දෙමළ සහ මුස්ලිම් ජනතාව ස්වකීය සංස්කෘතික අනන්‍යතාවය සුරක්ෂිත කරගැනීම සඳහා පෙළගැසුණි. කිසිදු

අවස්ථාවක ජාතීන් අතර අසමගියක් නොවූ අතර ස්වීය සංස්කෘතික අවශ්‍යතා ආරක්ෂා කිරීමේ ක්‍රියාදාමයක නිරතව ඇත. දහනමවැනි සියවස මුල දී ලංකාවට පැමිණි මිෂනාරි සංවිධාන විසින් පාසල් අරඹමින් බටහිර දැනුමත් කිතුනු ලබ්ධියත් ව්‍යාප්ත කරන්නට විය. එසේ පාසල් අරඹමින් ඒ ඔස්සේ ඉංග්‍රීසි අධ්‍යාපනය ලබා දීමේ වගකීම මිෂනාරීන්ට භාර වූ අතර දේශීය අධ්‍යාපන ක්‍රම නොසලකමින් බෞද්ධ හා හින්දු දරුවන් ළාබාල වියේ සිටම තමන් වෙත නම්මවා ගැනීමේ අරමුණින් එම ව්‍යාපාර ක්‍රියාත්මක විය. ක්‍රිස්තු ලබ්ධිය ව්‍යාප්ත කිරීමට යොදාගත් තවත් උපක්‍රමයක් වූයේ මුද්‍රිත පත්‍රිකා බෙදා හැරීම ය.

මෙම පසුබිමට එරෙහි ව ජාතික ව්‍යාපාර ද ක්‍රමයෙන් ඇරඹෙන්නට විය. භික්ෂූන් ජාතික ආගමික උරුමය ප්‍රතිස්ථාපනය කිරීමේ කර්තව්‍යයේ නිරත වීම කළුතර, පාණදුර, මොරටුව ආදී ප්‍රදේශවල සිදුවිය. එම බෞද්ධ ආගමික ප්‍රබෝධයේ මුල් පියවර ලෙස 1842 දී වලානේ සිද්ධාර්ථ හිමියන් විසින් රත්මලානේ ශාස්ත්‍ර ශාලාව පිහිට වීමත් සමඟ එය සිංහල බෞද්ධ පුනර්ජීවනයේ තෝතැන්න බවට පත්විය. සිංහල, පාලි සහ සංස්කෘතික පිළිබඳ නව ජීවයක් ඇති කරමින් බුදු දහම, බෞද්ධ සංස්කෘතිය සාහිත්‍ය පිළිබඳ අධ්‍යාපනය එම ආයතනය මගින් ලබා දුන්නේ ය. එම පුනරුදය සුමංගල හිමි, ධම්මාලෝක හිමි, ද සිල්වා, ඇපා අප්පුහාමි, කොග්ගල ධම්මතිලක හිමි, සුමනතිස්ස, ධම්මාලංකාර හිමි ආදී පැවිදි ගිහි විද්වතුන් ජනිත කිරීම සඳහා මග පෙන්වීමක් විය. වලානේ සිද්ධාර්ථ හිමියන් විසින් 1862 දී ප්‍රථම සිංහල පුවත්පත වූ ''ලක්මිණි'' පහන ඇරඹිණ. මෙම වර්ෂයේ දී ම සියම් දේශයෙන් ලැබුණු ආධාර පදනම් කරගෙන ලංකාවේ ප්‍රථම මුද්‍රණාලය ආරම්භ විය. පූජ්‍ය බුලත්ගම ධර්මාලංකාර සිරිසුමන තිස්ස හිමියන් 1860 දී ගාල්ලේ ලංකෝපකාර මුද්‍රණාලය අරඹන ලදුව කිතු සමයට එරෙහිව ප්‍රකාශිත පත්‍රිකා මුද්‍රණය කිරීම ආරම්භ කරන ලදී. එකල ජාතික ප්‍රබෝධය වර්ධන කළ තවත් අංගයක් වූයේ මිෂනාරීන් සමඟ ඇති වූ නොයෙකුත් වාද විවාදයන් ය. වාදීභසිංහ මිගෙට්ටුවත්තේ ගුණානන්ද නාහිමියන්ගේ පුරෝගාමී නායකත්වය කැපී පෙනේ. ඒ අනුව බද්දේගම, වරාගොඩ, ගම්පල, පාණදුර සහ උදන්විට ආදී වශයෙන් පංචමහාවාදයන් ඇතිවිය. මෙම වාද ඔස්සේ මිෂනාරි ව්‍යාපාරය බරපතල පසුබෑමකට ලක් වූ අතර බුදු දහම ලොව පුරා ව්‍යාප්ත වන්නටත් ඒ හේතු විය. මිගෙට්ටුවත්තේ ගුණානන්ද හිමියන්ගේ ජන්ම සමරුවේ 200 වන සංවත්සරයත් පානදුරාවාදයේ 150 වන සංවත්සරයත් 75 වන නිදහස් සමරුව යෙදෙන 2023 පෙබරවාරි මසම යෙදීම දෛවෝපගත සංසිද්ධියකි. මෑතකාලීන සිංහල බෞද්ධ පුනර්ජීවනයෙහිලා ප්‍රමුඛ වූ ජාතික වීරයෙකු ලෙස උන්වහන්සේ ද අභිවාදනය කළ යුතුය.

**ඡායාරූප අංක 9- වාදීභසිංහ මිගෙට්ටුවත්තේ ගුණානන්ද නාහිමි සහ පාණදුරාවාදය**

පංචමහා වාදයට අමතරව අගමික, සාහිත්‍යය සහ භාෂාමය ප්‍රබෝධයක් ඇති විය. සව්සත්දම් වාදය (1854) සිදත් සඟරාවාදය (1889) ජානකීහරණ වාදය (1891) ආදී වාදයන් 19 වන සියවසේ දෙවන භාගයේ දී ඇති වීම ජාතික නායකත්වයට ඔස්සේ ගිහි පැවිදි විශාල පිරිසක් මතු ව ඔවුහු බෞද්ධ ප්‍රබෝධයේ ක්‍රියාකාරීන් ලෙස හඳුනාගත හැකි ය. මෙම තත්ත්වය තුළ සිංහල භාෂාව නව සංකල්ප ප්‍රකාශ කරන මාධ්‍යයක් ලෙස පොදු පාඨක ජනයාගේ රුචිකත්වයට සරිලන හැඩ ගැස්වීම නිසා පෙර තිබුණාට වඩා සුබනම්‍ය සන්නිවේදන මෙවලමක් බවට පත්විය.

ඉංග්‍රීසි බලපෑම හමුවේ පසුබෑමකට ලක්ව තිබූ පිරිවෙන් අධ්‍යාපනය නැවත වරක් පිබිදීමට ලක්වීම මෙම අවදියේ ඇති වූ බෞද්ධ ප්‍රබෝධයේ තවත් විශේෂ ලක්ෂණයක් ලෙස පෙන්වා දිය හැකි ය. වලානේ සිද්ධාර්ථ හිමියන්ගෙන් ඇති වූ ශාසනික ප්‍රබෝධය පසුව බෙන්තර අත්ථදස්සී හිමියන් විසින් බෙන්තර වනවාසී විහාරය ද, අඹගහවත්තතේ සරණංකර හිමි පයාගල විහාරය ද, වැලිගම සුමංගල හිමි පාණදුරේ කේන්ද්‍ර කරමින් කරමින් භික්ෂූන් වහන්සේලාට ධර්ම ශාස්ත්‍ර ඥානය ලබාදුන් බව පෙනේ. පිරිවෙන් අධ්‍යාපනය නව මඟකයට යොමුවූයේ විද්‍යෝදය පිරිවෙන (1873) විද්‍යාලංකාර (1875) පිහිටුවීමත් සමඟ ය. බ්‍රිතාන්‍යයන් දේශීය අධ්‍යාපනය නොසලකා සිටිය ද පසු අවදියේ දී මේ පිරිවෙන් සඳහා රජයේ සහය ද ලැබුණු ආකාරයක් දැකිය හැකි ය. මෙම පිරිවෙන් ආරම්භ වීමට සාපේක්ෂ ව ලංකාවේ සෙසු ප්‍රදේශවල ද තවදුරටත් පිරිවෙන් ආරම්භ වන්නට විය. මෙම අවධියේ ග්‍රන්ථ රචනා කිරීම මෙන්ම සංස්කරණය කිරීමක් ද සිදුවිය. සිදත් සඟරාව, නව සන්නස, ධර්ම ප්‍රදීපිකාව, අමාවතුර, බුත්සරණ, මුවදෙව්දාවත ආදී සම්භාව්‍ය කෘති සංස්කරණය කොට පළ කිරීම කාලීන අවශ්‍යතාවන් සපුරාලීමක් මෙන්ම සිංහල ජාතික උරුමය පොදුජන විඥානය සඳහා පුබුදුවාලීමට හේතු විය. සිංහලයා ඉතිහාසය දෙසටත් අපගේ පැරණි ශිෂ්ටාචාරය පිළිබඳ කරනු ලැබූ අධ්‍යයනය තුළින් සිංහලයාගේ ගෘහ නිර්මාණය, ප්‍රතිමා කලාව, කැටම් කලාව, වාරි තාක්ෂණය ආදී විශිෂ්ට කටයුතු ගැන ජාතික අභිමානයක් මේ අවදියේ වර්ධනය වන්නට විය.

ලංකාවේ මෙම අවදියේ දී ඇති වූ බෞද්ධ ප්‍රබෝධය දේශීය වශයෙන් පමණක් නොව විදේශීය වශයෙන් ද ව්‍යාප්ත වන්නට විය. එහි ප්‍රතිඵලයක් ලෙස ඇමරිකානු ජාතික හෙන්රි ස්ටීල් ඕල්කට්තුමාගේ පැමිණීම ලක්දිව බෞද්ධ ප්‍රබෝධයට නව පණක් ලබාදීමට සමත් විය. පසුව පැමිණි බ්ලැවැට්ස්කි මැතිණියගේ ද සහය ඇතිව 1880 ජූනි මස 17 දින පරම විඥාර්ථ බෞද්ධ සමාගම ද ආරම්භ වූ අතර ඒ ඔස්සේ දේශීය වත්පිළිවෙත් ආරක්ෂා කිරීම සඳහා විශාල පිටිබලයක් සැපයිණ. පූජ්‍ය දොඩම්දූවේ පියරතන හිමියන් බෞද්ධ පාසලක් ආරම්භ කිරීම ද වැදගත් අවස්ථාවකි. ඕල්කට්තුමා 1881 දී "සිංහල ජාතියට අයිති අරමුදල්" මැයෙන් අරමුදලක් ආරම්භ කොට ප්‍රථමයෙන් ගාල්ලේ ඉංග්‍රීසි බෞද්ධ පාඨශාලාවක් ආරම්භ කරන ලදි. සිංහල බෞද්ධ පාසල් තව තවත් පුළුල් කර බෞද්ධාරක්ෂණ සංගමය පිහිටුවා බෞද්ධයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමට ඔවුහු පියවර ගත්තේ ය. ඒ අනුව බෞද්ධ පාසල් රටපුරා ආරම්භ විය. මෙහි දී කොළඹ, මහනුවර, හැටන්, ගම්පොළ, මාතලේ, හොරණ, රත්නපුර, අම්බලන්ගොඩ, පාණදුර, පට්ටිවැකඩ, මාදම්පිටිය හා කෙහෙල්වත්ත යන ස්ථානවල සිංහල පිරිමි සහ ගැහැනු පාසල් ආරම්භ වීම මෙරට බෞද්ධ ජනතාවට අත්වූ විශේෂත්වයකි. මෙම පසුබිමට සමගාමීව බෞද්ධ පාසල්වල පුළුල් වර්ධනයක් ඇති වේ.





**ඡායාරූප අංක 10- අනගාරික ධර්මපාලතුමා සහ ඇමරිකානු ජාතික හෙන්රි ස්ටීල් ඕල්කට්තුමා**

යටත්විජිත යුගයේ ජාතික ආගමික ප්‍රබෝධය ජනිත කිරීමෙහිලා ඉතා විශිෂ්ට කාර්යභාරයක් සාහිත්‍යධරයින් විසින් ද ඉටු කරනු ලැබී ය. ඒ මගින් සිංහල පුවත්පත් ක්ෂේත්‍රයේ මෙන්ම නාට්‍ය කලාව ද දියුණු විය. සී. දොන් බස්තියන්, බෙන්තොට ඇල්බට්, සයිමන් සිල්වා, ජෝන් ද සිල්වා, පියදාස

සිරිසේන, ආදී විද්වතුන්ගෙන් මෙරට බෞද්ධ සංස්කෘතිය පෝෂණය කිරීමෙහිලා නොමඳ සහයක් ලැබුණි. සිංහබා නූර්තිය, රෝමියෝ ජුලියට්, සුදාස සහ සාලනී, සුවර්ණතිලක ආදී නාට්‍යය හෙළ විරිත් රැක ගැනීමට ආදර්ශය සපයන්නට විය. දීර්ඝ ඉතිහාසයකට උරුමකම් කියන සිංහලයන්ගේ ඇඳුම් පැළඳුම් භාෂාව ආදී ගුණාංග ඉස්මතු කිරීමේ අරමුණින් ජෝන් ද සිල්වා නාට්‍ය 54ක් ලියා නිෂ්පාදනය කරන ලදි. ඒ අතුරෙන් පරාක්‍රමබාහු, දෙවන රාජසිංහ, සිරිසඟබෝ, වළගම්බා, මහානාම ආදී නාට්‍ය ඉතා ජනප්‍රිය ඒවා අතර විය. මිෂනාරීන් සිය ආගම ප්‍රචාරය කිරීම සඳහා ප්‍රබන්ධ කථා නිර්මාණය කරණු ලැබුව ත් ඊට සමාගාමීව පැරණි සංස්කෘතිය ඔප් නංවන ක්‍රියාමාර්ගයක් වෙත ජාතිකවාදී කලාකරුවෝ යොමුවිය. තව ද සිංහල බෞද්ධ පුනර්ජීවනයට අනගාරික ධර්මපාල, බ්‍රහ්මචාරි වලසිංහ හරිස්චන්ද්‍ර වැනි ක්‍රියාශීලී ජන නායකයන්ගෙන් ඉටු වූ මෙහෙවරත් ටිබෙටයෙන් පැමිණි එස්. මහින්ද හිමියන්ගේ මැදිහත්වීම ත් කැපී පෙනිණ.



**ඡායාරූප අංක 11- ටිබෙට් ජාතික එස්. මහින්ද හිමි**

අපේ රටට පිළිමල් වන සතුරු මුල
අපේ අයම නම් බිඳිනෙමු උන්ගෙ බල
අපේ මුතුන් මිත්තන් මළ සොහොන් වල
පිපේ එවිට ජාතික අභිමාන මල

**එස්. මහින්ද හිමියන් ලියූ කවියක්**

## සියලු ජාති ආගම් එක්ව නිදහස් සටනේ


බ්‍රිතාන්‍ය යටත්විජිත පාලනය නිසා දමිළ ජනතාවට ද අභියෝග රැසකට මුහුණ පෑමට සිදු විය. උතුරු ප්‍රදේශය කේන්ද්‍රගතව සිදු වූ මිෂනාරී බලපෑම නිසා හින්දු සංස්තෘතිය ද සුරක්ෂිත කිරීමේ අවශ්‍යතාව ප්‍රබලව දැනිණ. මේ බව වටහාගත් ආරුමුග නාවලර්තුමා ඒ සඳහා නායකත්වය ගන්නා ලදි. හෙතෙම හින්දු සංස්කෘතිය සුරක්ෂිත කිරීමට පියවර ගත්තේ ය. 1849 වන්නර්පොනෙයි ශෛව ප්‍රගාස

විද්‍යාසාලෙයි යනුවෙන් නූතන අධ්‍යාපන ක්‍රමවේදයක් හින්දුන්ට ආරම්භ කළේ ය. අනතුරුව ශෛව භක්තිය වර්ධනය කිරීම සඳහා සෑම ගමකම පාසල් ආරම්භ කිරීමට අදහස් කර 1872 දී ශෛවන්ගල විද්‍යාලය ඉංග්‍රීසී අධ්‍යාපනය සඳහා විවර කළේ ය. එය පසු කාලයේ හින්දු විද්‍යාලය බවට පත්විය. සාම්ප්‍රදායික දෙමළ ග්‍රන්ථ මුද්‍රණයට පියවර ගත්තේ ය. 1853 ආරම්භ කළ සයිව ප්‍රභානස සබෙයි සහ වනර්පොනෙයි සයිව දේවාලය ද ආරම්භ කිරීම නිසා හින්දු ප්‍රබෝධය ශක්තිමත් කිරීමට හැකි වීම සුවිශේෂී අවස්ථාවකි.



**ඡායාරූප අංක 12- ආරුමුග නාවලර්තුමා**

මුස්ලිම් ජනතාවට බ්‍රිතාන්‍ය බලපෑමේ අඳුරු ප්‍රතිඵල තදින් දැනුණේ ය. පිටුවහල් කරන ලද ඔරාබි පාෂා ඇතුළු පිරිස ඊජිප්තුවේ සිට 1883 දිවයිනට පැමිණියත් මුස්ලිම් පුනරුදයට දායකත්වයක් දැක්වුව ද එහි පුරෝගාමියා ලෙස සැලකෙන්නේ කටයුතු කරන්නේ එම්.සී. සිද්ධිලෙබ්බේ මහතා ය. ස්වකීය ජනතාව නගා සිටුවීම පිණිස "මුස්ලිම් නේයිෂන්" පුවත්පත ආරම්භ කර මහනුවර ප්‍රදේශයේ පාසලක් ද එතුමා විසින් ආරම්භ කරන ලදී. 1892 කොළඹ සහිරා විදුහල ආරම්භ කළ හෙතෙම 19 වන සියවසේ මුස්ලිම් පුනරුද ව්‍යාපාරයට මනා නායකත්වයක් ලබා දුන්නේ ය. ජාතියක් ලෙස අනන්‍යතාව ආරක්ෂා කරගත යුතු ආකාරය එතුමා ලොවට පෙන්වීමට ආදර්ශවත්ව කටයුතු කරන ලදි. ඒ අනුව ස්වකීය මුස්ලිම් සාම්ප්‍රදායික සිරිත් විරිත් හා විවාහ ක්‍රම අතුළු මුළු සංස්කෘතියම ආරක්ෂා කරගනිමින් කාලානුරූපව සැකසීමට ඔහු පියවර ගත්තේ ය. මෙම පුනරුද ව්‍යාපාරය තුළින් මුස්ලිම් ප්‍රජාව ද ඉදිරියට පැමිණියහ.



**ඡායාරූප අංක 13- එම්.සී. සිද්දිලෙබ්බේ මහතා**

19 වන සියවසේ අවසාන භාගය දක්වා ම ජාතීන් අතර මනා සමගියක් පැවති අතර පොදු සතුරා වූ බ්‍රිතාන්‍ය අධිරාජ්‍ය පාලනයට එක්ව මුහුණ දුන්නේ ය. එවකට සමාජය විනාශ මුඛයට පැමිණියේ මත්පැන් නිසා ය. අමද්‍යප ව්‍යාපාරය වටා ඒකරාශී වූ ශ්‍රී ලාංකික ජනතාව අධිරාජ්‍යවාදී පාලනයට දැඩි බලපෑමක් එල්ල කිරීමට සමත් විය.

20 වන සියවස උදාවත් ම සිදු වූයේ ශ්‍රී ලංකාව නිදහස කරා ගිය ගමනේ බ්‍රිතාන්‍ය අධිරාජ්‍යය විරෝධී අරගලයේ තෙවන අවස්ථාව ලෙස ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ මගින් බලය දිනාගැනීමේ ව්‍යාපාරයක නිරත වීමයි. ඉන්දියානු ආදර්ශය මත සිට සිදු කළ එය ක්‍රමික උත්සාහයක ප්‍රතිඵලයකි. බටහිර අධ්‍යාපනයෙන් පෝෂණය වූ උගත් ලාංකික මධ්‍යම පන්තිය විසින් ඉල්ලීම්, ලිපි, උද්ඝෝෂණ සහ පෙත්සම් මගින් දේශපාලන ප්‍රතිසංස්කරණ දිනාගැනීම සඳහා ක්‍රියාකර ඇත. 1833 කෝල්බෲක් කැමරන් ප්‍රතිසංස්කරණ මෙරට ක්‍රියාත්මක වූ පළමු දේශපාලන ප්‍රතිසංස්කරණය ලෙස ඉතිහාස ගත වෙයි. එතැන් සිට 1912 (කෲවේ මැකලම්), 1920 (මැනිං ප්‍රතිසංස්කරණ), 1924 (මැනිං ඩෙවොන්ෂයර් ප්‍රතිසංස්කරණ), 1931 (ඩොනමෝර් ප්‍රතිසංස්කරණ) සහ 1947 (සෝල්බරි ප්‍රතිසංස්කරණ) ක්‍රියාත්මක විය. මෙම ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක වීමේ දී සිංහල, දෙමළ සහ මුස්ලිම් නායකත්වය හා දායකත්වය මොනොවට හිමි විය. 1919 පිහිටුවන ලද ලංකා ජාතික සංගමය මෙහිලා පුළුල් කාර්යභාරයක් සිදු කර ඇත. 1948 පෙබරවාරි 04 වන දින බ්‍රිතාන්‍ය අධිරාජ්‍යවාදී පාලනයෙන් මහාමාන්‍ය ඩී.එස්. සේනානායක අගමැතිතුමා යටතේ ඩොමිනියන් තත්ත්වයේ නිදහස් ජාතියක් ලෙස ශ්‍රී ලංකා ධජය එසැවුණු අතර 1972 දී ජනරජයක් වීම තුළ මෙරට පූර්ණ නිදහස් ස්වෛරී රාජ්‍යයක් බවට පත් විය.

## වීරයෝ නොමියෙති

බටහිර ආක්‍රමණකාරී සතුරන් විෂයයක අනලස්ව අධිෂ්ඨානයෙන් හා වීර්යයෙන් ළඟා කරගත් ජයග්‍රහණ රාශියක් ශ්‍රී ලාංකේය ඉතිහාසය පුරාම දැකිය හැකි ය. විදේශීය ආක්‍රමණිකයන්ට විරුද්ධව විමුක්තිය උදෙසා සටන් වැදුණු විරෝදාර මුතුන් මිත්තන් අපේ සමාජයට සැබෑ වීරවරයෝ ය. ආක්‍රමණිකයන් ඉදිරියේ ඔවුන් දේශද්‍රෝහීන් වුවත් ජාතිකත්වය හමුවේ වීරයන් විය. ශ්‍රී ලාංකේය ඉතිහාසය පැමිණි අඛණ්ඩ ගමන් මඟ තුළ විමුක්තිය උදෙසා සටන් කළ අපේ වීරයන්ගේ ලේ සහ ඇට මස් මිදුළු මෙන්ම ඔවුන්ගේ ප්‍රාණ වායුව ද අපේ මව් බිමත්, සුළඟත් සමඟ එක් වී සදා කල් පවතී. එකල ලොව ප්‍රබලම හමුදාව වූ බ්‍රිතාන්‍ය හමුදාවට සම්පූර්ණ ආක්‍රමණයකින් අපේ රට යටත් කරගන්නට නොහැකි විය. ගරිල්ලා සටන් හා අංගම්පොර වැනි දේශීය සටන් කලා හමුවේ විජාතිකයෝ මෙරට තුළ මරු දුටහ. තිස්වසරක බෙදුම්වාදී ත්‍රස්වාදී ව්‍යාපාරය පරාජය කරමින් ලේ අත් පා මෙන්ම ජීවිත පිදූ අපේ වීරෝදාර සෙබළුන්ගේ ජානවල ද ඒ අතීත විරුවන්ගේ උරුමය සටහන්ව තිබෙන්නට ඇත.

අප අද ගන්නා හුස්ම පොද ඒ විරුවන්ගේ ප්‍රාණ වායුවයි. රටේ විමුක්තිය උදෙසා ජීවිතය දන් දුන් නම් ගම් දන්නා නොදන්නා වීරවරයන්ට පිදෙන ගෞරවය වර්තමාන පරපුරෙන් අතීතය වෙත පුද කෙරෙන ගෞරවාචාරයක් පමණක් නොව මෙරට ඒකඡත්‍රභාවයත් භෞමික අඛණ්ඩතාවත් ස්වෛරීත්වයත් අදීනත්වයත් වෙනුවෙන් දිවි හිමියෙන් පෙනී සිටීමක් ද වන්නේ ය. අතීත විරුවන් අනුස්මරණය යනු ඔවුන් සිහි කොට මල් පිදීම පහන් දැල්වීම හෝ උත්සව සංවිධාන කිරීම පමණක් නොව ඔවුන්ගේ ලාලසාව වූ රටේ අභිවෘද්ධිය වෙනුවෙන් අපේ ජීවිතය අවංකව කැප කිරීම බවද අප වටහා ගත යුත්තෙමු.



**ඡායාරූප අංක 14-සිංහ ධජය සෙවනේ වැජඹෙන අපි**

**එක මවකගෙ දරු කැළ බැවිනා**

**යමු යමු වී නොපමා...**

**සැකසුම :**

**මහාචාර්ය අජිත් තල්වත්ත**
මානවශාස්ත්‍ර අධ්‍යනාංශය, සමාජීය විද්‍යා හා මානවශාස්ත්‍ර පීඨය
ශ්‍රී ලංකා රජරට විශ්විද්‍යාලය, මිහින්තලේ.

**එම්. ඒ. ප්‍රසාද් කුමාර**
කථිකාචාර්ය, මානවශාස්ත්‍ර අධ්‍යයනාංශය, සමාජීය විද්‍යා හා මානවශාස්ත්‍ර පීඨය,
ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය, මිහින්තලේ.

**නාලක ජයසේන**
ස්වාධීන පර්යේෂක, සම්මානලාභී ලේඛක